# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයේ අර්බුදය

**විජිතපුර විමලරතන හිමි**

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකා ජනගහනයෙන් ඉතාමත් ඉහළ ප්‍රතිශතයක් තවදුරටත් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. එහෙත් ඔවුන් නියුක්ත ව ඇති රැකියාවන් බොහොමයක් ම නාගරික පරිසරය හා බැඳුණ ඒවා වෙයි. එම නිසා ඔවුන්ගෙන් සමහරක් සූදුසු වන්නේ ග්‍රාමීය අංශය තුළ ජීවත්වීමට නොව, නාගරික අංශය තුළ ජීවත්වීමට ය. ග්‍රාමීය අංශය තුළ ජීවත් වෙමින් ඊට අදාළ ව කෘෂිකර්මාන්තයේ නියුතු වූවෝ ද කාලයත් සමඟ අර්බුදකාරී ගැටලු සමූහයකට මුහුණ දෙමින් සිටිති. ඒ අතුරින් ප්‍රධානතම ගැටලුව වන්නේ ඔවුන්ට කෘෂිකර්මාන්තය සඳහා ඇති ඉඩම්වල ප්‍රමාණය ක්‍රමයෙන් පහළ යමින් පැවතීම යි. මේ නිසා කෘෂිකර්මාන්තයෙන් උපදින ආදායම ඔවුන්ගෙන් බහුතරයකගේ නඩත්තුවටවත් ප්‍රමාණවත් නොවේ. ඒ හේතුවෙන් ග්‍රාමීය අංශය තුළ ඉහළ දරිද්‍රතාවයක් පවතින අතර, එය අනාගතයේ දී තවදුරටත් ඉහළ යාමට ඇති ඉඩකඩ බැහැර කළ නො හැක. විවිධාකාරයේ සහනාධාර සහිත සහ නිරසාර බවකින් තොර වූ ග්‍රාමීය සංවර්ධන වැඩපිළිවෙළ මඟින් සිදු කරන්නේ ග්‍රාමීය අංශයෙ හි දරිද්‍රතාවත් ඒ හා බැඳුණ ප්‍රශ්න සියල්ලත් තාවකාලික ව යටපත් කිරීම පමණි. විකල්ප සංවර්ධන උපාය මාර්ග පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු නො කරන්නේ නම් මෙරට ග්‍රාමීය ආර්ථිකය කඩා වැටීම වළක්වාලිය නො හැකි ය. අධික ජනගහනයක් සිටින ශ්‍රී ලංකාවේ තෙත් කලාපය සම්බන්ධයෙන් මෙය වර්තමානයෙහි වඩාත් සත්‍ය වන අතර, වියළි කලාපය තුළ ද දැන් එම ප්‍රශ්නය උග්‍ර වෙමින් පවතී. තෙත් කලාපය තුළ පවතින ගැටලුවට පිළියමක් ලෙස කාලයකට පෙර වියළි කලාපයේ ගොවි ජනපද ව්‍යාපාර ආරම්භ කරන ලදී. එහෙත් පරම්පරා කීපයක් ගෙවී ගිය ද ඒවායෙ හි ද මුලින් තෙත් කලාපයෙ හි තිබූ ගැටලු මතු වෙමින් පවතී.*

## 1. හැඳින්වීම

ලෝකයේ බොහෝ දියුණු රටවල ආර්ථික, ඉතිහාසය දෙස බලන විට සාමාන්‍යකරණය කළ හැකි කරුණක් වන්නේ, එවා කෘෂිකර්මාන්තයෙන් තම සංවර්ධනය ආරම්භ කොට, පසුව කර්මාන්ත අංශය දියුණු කර, අනතුරු ව සේවා අංශය කරා ගමන් කර ඇති බව යි. සංවර්ධනයෙ හි මුල් වකවානුවල ජාතික නිෂ්පාදිතයට, රටේ සේවා නියුක්තියට, රාජ්‍ය ආදායමට හා අපනයන ඉපැයීම්වලට කෘෂි අංශයෙන් කළ දායකත්වය ඉහළ මට්ටමක පැවති අතර, පසුව එය කර්මාන්ත අංශයට පරිවර්තනය විය. එයිනුත් අනතුරු ව සේවා අංශය එම රටවල ප්‍රමුඛ කාර්යභාරය කරන ආර්ථික අංශය බවට පත් විය. මේ නිසා බොහෝ දියුණු රටවල දැනට ආර්ථිකයෙ හි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබන්නේ සේවා අංශය යි.

ශ්‍රී ලංකාව ඓතිහාසික වශයෙන් කෘෂිකර්මාන්තයට උරුමකම් කියන ලද ආර්ථිකයක් සහිත රටකි. එහි වැදගත් ම ආර්ථික ඒකකය වූයේ ගම යි. මෙරට සභ්‍යත්වය

වියළි කලාපය කේන්ද්‍ර කරගත් යුගවල වැව, පන්සල, කුඹුරු සහ ජනාවාස වූ ප්‍රදේශය (ගංගොඩ) යන ඒවා ගමේ අනන්‍යතාවය තහවුරු කළ මූලිකාංග විය. ඊට අමතර ව දර සපයාගැනීම, ගව ආදී සතුන් පෝෂණය කිරීම, හේන් වගා කිරීම, ඖෂධ ලබා ගැනීම, දඩයම් කිරීම හා වෙනත් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ගමට වෙන් වූ කැළෑ රොදක් ද විය. මීට අමතර ව එළිපෙහෙළි කිරීමට අවසර නැති 'තහන්සි කැළෑ' (රක්ෂිත) ද විය (සේනාරත්න, පී.එම්. 2005). මේ යුගයෙ හි එක ගමක් තවත් ගමකින් පැහැදිලිව වෙන් කොට හඳුනාගත හැකි විය. සභ්‍යත්වය තෙත් කලාපයට පැමිණීමත් සමඟ වාරි ජලයෙ හි වැදගත්කම අඩු වී වැව ගමෙන් ඉවත් විය. එසේ ම ස්වයංපෝෂිත කෘෂිකර්මාන්තය වෙනුවට ක්‍රමයෙන් වාණිජ භෝග වගාවට ද නැඹුරු වන්නට විය. යටත්විජිත පාලන සමයන් තුළ වාණිජ භෝග වගාව තවදුරටත් වේගවත් වර්ධනයක් පෙන්වන ලදී. මීට සමගාමී ව සාම්ප්‍රදායික ගමෙ හි පැවති අනන්‍යතාවය ද කෙමෙන් වෙනස් වන්නට විය. වර්තමානයෙ හි දකිය හැක්කේ මෙසේ පරිණාමයට පත් වූ ගම යි. වියළි කලාපයෙ හි ගම් ද මීට සමගාමී ව වෙනස්කම්වලට භාජනය විය.

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින ඇතැම් රටවල වර්තමාන ආර්ථික සංවර්ධනයෙ හි ආරම්භක යුගය කෘෂිකර්මාන්තය මත රැඳුණි. ආර්ථික පරිණාමයෙ හි ඊළඟ වැදගත් ම අදියර වන කර්මාන්ත සංවර්ධනය පසෙක ලා වේවා තම ගමන කෙළවර කරනු ලැබුයේ සේවා අංශයෙනි. මේ නිසා සංවර්ධනයෙ හි මුල් වකවානුවල ජාතික නිෂ්පාදනයට හා සේවා නියුක්තියට කෘෂිකර්මාන්ත අංශයෙන් කළ දායකත්වය ඉහළ වූ අතර, දැනට එම ස්ථානය සේවා අංශයට ලැබී තිබේ. ආර්ථික පරිණාමයෙ හි එක් තීරණාත්මක අදියරක් මේ රටවල් විසින් තම කර්මාන්ත අංශයට ලබා දුන්නේ නැත.

මෙරට ඉදිරි අනාගතය දෙස බැලුව ද එහි තවදුරටත් පුළුල් වනු ඇත්තේ සේවා අංශය යි. සංවර්ධනය සඳහා වූ දිරි දීමනාවන් ප්‍රධාන වශයෙන් ම ලැබෙන්නේ ද සේවා අංශයට යි. මේ සියල්ලටමත් වඩා මූලික අධ්‍යාපනය තුළින් ජනතාවගේ මනස සකස් කරනු ලබන්නේ කෘෂිකාර්මික හෝ කර්මාන්ත අංශයෙ හි රැකියාවන් කිරීමට නොව, සේවා අංශයට ඔවුන් මෙහෙයවීමට ය. එසේ ම උසස් අධ්‍යාපනය මඟින් ලබා දෙන දැනුම හා පුහුණුව යන දෙක ම බොහෝ විට කෘෂිකර්මාන්ත හෝ කර්මාන්ත යන අංශවලට අදාළ වූ ඒවා නොව, සේවා අංශය ප්‍රවර්ධනය කරන ඒවා ය.

දියුණු රටවල ආර්ථික පරිණාමයෙ හි මුල් වකවානුවල ග්‍රාමීය ජනගහනය ඉහළ මට්ටමක පැවති අතර, කර්මාන්ත හා සේවා අංශය පුළුල්වීමත් සමඟ ඒවායෙ හි නාගරික ජනගහනයේ ප්‍රතිශතය ඉතාමත් ඉහළ මට්ටමකට පැමිණුණි. දැන් මෙම රටවල අතිමහත් බහුතර ජන සංඛ්‍යාවක් වාසය කරනු ලබන්නේ නාගරික ප්‍රදේශවල ය. එය එම ජනතාව කරන ආර්ථික කටයුතු සමඟ මනාව ගැළපෙයි. එසේ ම තවදුරටත් ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවලට ජනතාව පැමිණෙමින් සිටී. මෙනිසා නාගරික ජනගහනය තවදුරටත් ඉහළ යනු ඇත. ග්‍රාමීය ප්‍රදේශවල ඉතිරිවී සිටින ජනතාව කෘෂිකර්මාන්තය හා සත්ව පාලනය ආශ්‍රිත කටයුතු කරගෙන යයි. ඒවා බොහෝ විට කුඩා පරිමාණ ව නොව, මධ්‍ය හෝ මහා පරිමාණ වශයෙන්

කෙරෙන කටයුතු ය. එනිසා ඔවුන්ට නූතන යන්ත්‍රසූත්‍ර භාවිතයටත්, පරිමාණ පිරිමැසුම් සහිතව නිෂ්පාදන කටයුතු කිරීමටත් ඉඩ ප්‍රස්තාවන් විවෘත ව පවතී. එපමණක් නොව, මෙකී නිෂ්පාදකයින්ට ගුණාත්මක බවින් ඉහළ භාණ්ඩ අඛණ්ඩ ව වෙළෙඳපොළට සැපයීමටත් හැකියාව ලැබී ඇත. ඔවුන් තම යැපීමට වඩා ඉතා විශාල අතිරික්තයක් නිෂ්පාදනය කරන බැවින් ඒවා ජාතික ව හා ජාත්‍යන්තර ව අලෙවි කරයි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශය දෙස බලන විට එහි දිගින් දිගට ම උග්‍ර වෙමින් පවත්නා අර්බුදකාරී ලක්ෂණ සමූහයක් හඳුනාගත හැකි ය. මතුපිටින් ග්‍රාමීය අංශය වඩා ආකර්ෂණීය හා දීප්තිමත් අනාගතයක් ඇති අංශය යැයි සඳහන් වුවත් මෙකී අර්බුදකාරී තත්ත්වය නිසා අනාගතයේ දී මෙරට ග්‍රාමීය අංශයත් එහි ආර්ථික කටයුතුත් මහත් ආගාධයකට ඇද වැටීමට ඉඩ ඇත. සාම්ප්‍රදායික ග්‍රාමීය අංශය තුළ හඳුනාගෙන ඇති පසුගාමී ආර්ථික ලක්ෂණයන් අතර දරිද්‍රතාවය, ණයගැති බව, ඉඩම් හිඟය, ඉඩම් අයිතිය පිළිබඳ ගැටළු, සාම්ප්‍රදායික වගා ක්‍රම හා වගා සම්ප්‍රදායන්, යටිතල පහසුකම්වල හිඟය හා අලෙවිකරණ ගැටළු ආදී වශයෙන් දීර්ඝ ලේඛනයක් සැකසිය හැකි ය. මේවායින් සමහරක් සමාජ නවීකරණයත් සමඟ ඉබේ ම අහෝසි වී යනු ඇත. තවත් සමහරක් සඳහා රාජ්‍ය ආයතන මඟින් සිදු කරන මැදිහත්වීම් මඟින් විසඳුම් ලබා ගත හැකි ය. එහෙත් ග්‍රාමීය අංශයෙ හි පවතින ගැටළු තිරසාර පදනමක් මත ආමන්ත්‍රණය නො වන්නේ නම් අනාගතයේ දී එම අංශය තුළ පවත්නා වූ පසුගාමී ලක්ෂණ තව තවත් උග්‍රවීමටත්, අර්බුදකාරී වාතාවරණයන් ඇතිවීමටත් ඉඩකඩ ඇත. මෙම ලිපියෙ හි අරමුණ එවැනි ගැටළු කිහිපයක් හඳුනාගෙන ඒවාට අවශ්‍ය කරන විසඳුම් සාකච්ඡා කිරීම යි.

මෙහි ග්‍රාමීය ප්‍රදේශ යනුවෙන් අදහස් කරන්නේ නගරවලින් බැහැර ව කෘෂිකාර්මික කටයුතු කෙරෙන ප්‍රදේශයන් ය. දේශීය හෙවත් සාම්ප්‍රදායික කෘෂි අංශයත්, ව්‍යාපාරික වතු වගාවත් යන දෙක ම ඒ තුළට ඇතුළත් කරනු ලැබේ. ඒ අංශ දෙක ම වගා කටයුතු මත මත රැඳුණු ඒවා ය. මෙකී කෘෂිකාර්මික ආර්ථිකය සමඟ බැඳුණු සත්ව පාලනය, ධීවර කර්මාන්තය හා වන ද්‍රව්‍ය යන නිෂ්පාදන අංශ ද ග්‍රාමීය ආර්ථිකයේ ම කොටසක් වශයෙන් මෙහි දී සැලකිල්ලට ගැනේ.

## 2. ඒක පුද්ගල භූමි ප්‍රමාණය පහළ යාම

ශ්‍රී ලංකාවේ ජනගහනය පසුගිය කාලය පුරා ම වර්ධනය විය. එහි වර්ධන වේගය වර්තමානයෙ හි පහළ මට්ටමක පැවතුණ ද ඉදිරියේ දී මුළු ජනගහනයෙ හි ප්‍රමාණය තවදුරටත් ඉහළ යනු ඇත. ඒ අනුව රටේ ඒක පුද්ගල භූමි ප්‍රමාණය ක්‍රමයෙන් තවදුරටත් පහළ යාම වැළැක්වීමට හැකියාවක් නැත. විශේෂයෙන් ම නිවාස, පාරවල්, පොදු ගොඩනැගිලි, කර්මාන්ත ආදිය ඉදිවීමත් සමඟ වගා කළ හැකි ඒක පුද්ගල ඉඩම්වල ප්‍රමාණය තවදුරටත් පහළට ගමන් කරනු ඇත. මෙවැනි ඉදි කිරීම් කටයුතු බොහෝ දුරට සිදු වන්නේ ද කෘෂිකාර්මික ඉඩම් ආශ්‍රයෙනි. එනිසා ග්‍රාමීය අංශයෙ හි කෘෂිකර්මාන්තයේ නියුක්ත වූවන්ට මෙය දැඩි ව බලපානු ඇත. ග්‍රාමීය ප්‍රදේශවල පදිංචිව සිටින, එහෙත් කෘෂි අංශයෙ හි රැකියා නො කරන අයට සහ නාගරික ප්‍රදේශවල පදිංචි වූවන්ට මෙය එතරම් ම බලපාන්නේ නැත.

වගුව 1

## ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල භූමි ප්‍රමාණය (වර්ග කිලෝමීටර්)

| දිස්ත්‍රික්කය | 1871 | 1931 | 1963 | 1971 | 1981 | 2001 |
|---|---|---|---|---|---|---|
| **බස්නාහිර පළාත** | **0.0126** | **0.00504** | **0.00285** | **0.00245** | **0.00334** | **0.00248** |
| කොළඹ | 0.00163 | 0.00065 | 0.00032 | 0.00026 | 0.00041 | 0.00031 |
| ගම්පහ | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.001 | 0.00067 |
| කළුතර | 0.01097 | 0.00439 | 0.00253 | 0.00219 | 0.00193 | 0.0015 |
| **මධ්‍යම පළාත** | **0.06476** | **0.02605** | **0.01404** | **0.01184** | **0.01031** | **0.00851** |
| මහනුවර | 0.00835 | 0.0033 | 0.00186 | 0.00163 | 0.00185 | 0.00152 |
| මාතලේ | 0.0265 | 0.01537 | 0.0078 | 0.00634 | 0.00558 | 0.00452 |
| නුවරඑළිය | 0.02991 | 0.00738 | 0.00438 | 0.00387 | 0.00288 | 0.00247 |
| **දකුණු පළාත** | **0.06029** | **0.03004** | **0.01458** | **0.01211** | **0.01017** | **0.00832** |
| ගාල්ල | 0.0085 | 0.00454 | 0.00258 | 0.00225 | 0.00203 | 0.00167 |
| මාතර | 0.00895 | 0.00453 | 0.00249 | 0.00219 | 0.00199 | 0.00169 |
| හම්බන්තොට | 0.04284 | 0.02097 | 0.00951 | 0.00767 | 0.00615 | 0.00496 |
| **උතුරු පළාත** | **0.23105** | **0.18989** | **0.06355** | **0.04778** | **0.08863** | **0.05995** |
| යාපනය | 0.00416 | 0.00288 | 0.00167 | 0.00146 | 0.00139 | 0.00209 |
| කිලිනොච්චිය | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.01394 | 0.01005 |
| මන්නාරම | 0.09833 | 0.07952 | 0.03321 | 0.02566 | 0.01879 | 0.01317 |
| වවුනියාව | 0.12856 | 0.10749 | 0.02867 | 0.02066 | 0.02061 | 0.01313 |
| මුලතිව් | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.0339 | 0.02151 |
| **නැගෙනහිර පළාත** | **0.21865** | **0.11428** | **0.05509** | **0.04181** | **0.03064** | **0.02134** |
| මඩකලපුව | 0.07808 | 0.04156 | 0.01455 | 0.01112 | 0.00864 | 0.00587 |
| අම්පාර | - | - | 0.02085 | 0.0162 | 0.01135 | 0.00745 |
| ත්‍රිකුණාමලය | 0.14057 | 0.07272 | 0.01969 | 0.01449 | 0.01065 | 0.00802 |
| **වයඹ පළාත** | **0.06836** | **0.03264** | **0.01581** | **0.01282** | **0.01021** | **000763** |
| කුරුණෑගල | 0.02325 | 0.01212 | 0.00565 | 0.0047 | 0.00397 | 0.0033 |
| පුත්තලම | 0.04511 | 0.02052 | 0.01016 | 0.00812 | 0.00624 | 000433 |
| **උතුරු මැද පළාත** | **0.1644** | **0.10752** | **0.05457** | **0.03858** | **0.0248** | **0.0188** |
| අනුරාධපුරය | 0.1644 | 0.10752 | 0.02566 | 0.01846 | 0.01221 | 0.00963 |
| පොළොන්නරුව | - | - | 0.02891 | 0.02012 | 0.01259 | 0.00917 |
| **ඌව පළාත** | 0.06589 | 0.02803 | 0.04814 | 0.03387 | 0.02507 | 0.01786 |
| බදුල්ල | - | - | 0.00548 | 0.00465 | 0.00446 | 0.00367 |
| මොණරාගල | 0.06589 | 0.02803 | 0.04266 | 0.02922 | 0.02061 | 0.01419 |
| **සබරගමුව පළාත** | 0.0516 | 0.01779 | 0.00893 | 0.00754 | 0.00658 | 0.00538 |
| රත්නපුරය | 0.03552 | 0.01241 | 0.006 | 0.00495 | 0.00411 | 0.00322 |
| කෑගල්ල | 0.01608 | 0.00538 | 0.00293 | 0.00259 | 0.00247 | 0.00216 |

*ලැ.නො. : ලැබී නොමැති දත්ත*

* *සමහර දිස්ත්‍රික්කවල සියලු ම වර්ෂ සඳහා දත්ත අන්තර්ගත නො වන්නේ එම වකවානුව වන විට එම දිස්ත්‍රික්ක වෙන ම පරිපාලන ඒකක වශයෙන් නො තිබුණු බැවිනි.*

මූලාශ්‍රය : *Statistical Abstract (2008). Population and Housing Statistics in 1981/2001. Department of Census and Statistics.*

1870 ගණන්වල සිට සෑම පළාතක ම, සෑම දිස්ත්‍රික්කයක ම ඒක පුද්ගල භූමි ප්‍රමාණය පහළ ගොස් ඇත. වේගවත් ආර්ථික සංවර්ධනයක් සහිත අභ්‍යන්තරික වශයෙන් ඉහළ ජන සංක්‍රමණයක් පෙන්වන බස්නාහිර පළාත තුළ ඒක පුද්ගල ඉඩම්වල ප්‍රමාණය සීඝ්‍ර වශයෙන් පහළ ගොස් ඇත (වගු අංක 1). මෙහි ජනගහනය ක්‍රමයෙන් කෘෂිකර්මාන්තයෙන් ඉවත් වෙමින් වෙනත් ආර්ථික කටයුතුවලට ඉහළ නැඹුරුවක් දක්වන නිසා ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය පහළ යාම එහි ජනතාවගේ ආදායම කෙරෙහි බලපෑමක් කරන්නේ නැත යන්න පිළිගත හැකි ය. වර්ෂ 1977 ආර්ථික නිදහස්කරණයත් සමඟ විවිධ කර්මාන්ත හා සේවා අංශවල නව රැකියා විශාල ප්‍රමාණයක් මේ පළාත තුළ බිහි වී ඇත. එහි වැසියන්ට කෘෂිකර්මාන්තය වෙනුවට විකල්ප රැකියා කිරීම වඩාත් වාසිදායක තත්ත්වයක් ඇති කර තිබේ. එහෙත් කෘෂිකර්මාන්තය මූලික හෝ අතිරේක ආදායම් මාර්ගයක් වශයෙන් භාවිත කරන බොහෝ දෙනාගේ ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය පහළ යාම ඔවුන්ගේ ආදායම් කෙරෙහි බලපෑමක් කරනු ඇත.

බස්නාහිර පළාත හැරුණු විට අනෙකුත් පළාත්වල කෘෂිකර්මාන්තය තවදුරටත් ඉහළ වැදගත්කමක් දරනු ලබයි. විකල්ප රැකියා අවස්ථාවන් ප්‍රමාණාත්මක ව බිහි නො වන මෙකී පළාත්වල කෘෂි අංශයෙහි නියුක්ත ජනතාවගේ ආදායම් කෙරෙහි එය දැඩි ලෙස බලපානු ඇත. එකී පීඩනය අධික පළාත් හෝ දිස්ත්‍රික්කවල ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් තාවකාලික වශයෙන් රැකියාවන් කිරීම සඳහා බස්නාහිර පළාතට පැමිණෙයි.

තේ, රබර් හා පොල් ව්‍යාපාරික භෝග වශයෙන් බ්‍රිතාන්‍ය යුගයේ ව්‍යාප්ත විය. ශ්‍රී ලංකා ආර්ථිකයෙ හි නූතන යුගයේ සංවර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ම දායක වූයේ මෙකී භෝග වගාවන් ය. මේ වගාවන් තුනෙ හි ම ඒක පුද්ගල වගා ප්‍රමාණය දශක හතරක තරම් කාලයක් තුළ අඩකින් පමණ පහළ ගොස් ඇත.

තේ වගාව සිදු කෙරෙන ප්‍රධාන වගා දිස්ත්‍රික්ක වන නුවරඑළිය, මහනුවර, බදුල්ල, මාතලේ යන සෑම එකක ම ඒක පුද්ගල වගා ඉඩම් ප්‍රමාණය විශාල වශයෙන් පහළ ගොස් ඇත (වගු අංක 2). එහෙත් කළුතර, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්කවල ඒක පුද්ගල තේ ඉඩම් ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. තේ මිල සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතීම නිසා ප්‍රධාන වශයෙන් ම රබර් ඉඩම්වල තේ වගාව ව්‍යාප්ත කිරීම නිසා මෙකී වැඩිවීම සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඒක පුද්ගල රබර් ඉඩම්වල ප්‍රමාණය අඩුවීමට ද එය බලපෑමක් විය.

ඒක පුද්ගල රබර් ඉඩම් ප්‍රමාණය එම වගාව ව්‍යාප්ත ව තිබූ සෑම දිස්ත්‍රික්කයක ම පහළ ගොස් ඇත. ප්‍රධාන වගා දිස්ත්‍රික්ක වන කළුතර, රත්නපුර හා කෑගල්ල යන ඒවායෙ හි මෙකී පහළ යාම කැපී පෙනෙයි.

ඓතිහාසික වශයෙන් ශ්‍රී ලාංකීය ජන ජීවිතයෙ හි වෙන් කළ නො හැකි වගාවක් වූ පොල් වගාව බ්‍රිතාන්‍ය පාලන සමයෙ හි ව්‍යාපාරික භෝගයක් බවට පත් විය. පසුගිය දශක හතරක පමණ කාලය තුළ මේ වගාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා දිස්ත්‍රික්ක වන කුරුණෑගල, පුත්තලම, කෑගල්ල හා කොළඹ යන සෑම ප්‍රදේශයක් තුළ ම විශාල පීඩාවකට පත් විය. මෙකී දිස්ත්‍රික්කවල ඒක පුද්ගල වගා ඉඩම් ප්‍රමාණය සීඝ්‍ර වශයෙන් පහළ ගොස් ඇත. මොණරාගල, බදුල්ල හා නුවරඑළිය යන

දිස්ත්‍රික්කවල ඒක පුද්ගල වගා ඉඩම් ප්‍රමාණය ආන්තික වශයෙන් ඉහළ ගිය ද අන් සෑම දිස්ත්‍රික්කයක ම ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය පහළ ගොස් ඇත.

දනට ම රටේ මුළු ඉඩම්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් ස්ථිර වගාවන් වන තේ, රබර් හා පොල් වගාවන් සඳහා වෙන් කර ඇත. මේවා ප්‍රධාන වශයෙන් උඩරට හා පහතරට තෙත් කලාපයට සීමා වී ඇත. ඒක පුද්ගල තේ, රබර් හා පොල් ඉඩම් ප්‍රමාණය පසුගිය කාලය පුරා ම ජනගහන වර්ධනයත් සමඟ ක්‍රමයෙන් පහළ ගොස් ඇත.

## වගුව 2

### වගා කර ඇති භෝගය අනුව ඒක පුද්ගල භූමි ප්‍රමාණය (අක්කර)

| දිස්ත්‍රික්කය | තේ | | රබර් | | පොල් | |
|---|---|---|---|---|---|---|
| | 1962 | 2002 | 1962 | 2002 | 1962 | 2002 |
| කොළඹ | 0.00058 | 0.00017 | 0.01219 | 0.00775 | 0.09966 | 0.008 |
| ගම්පහ | ලැ.නො. | 0.00001 | ලැ.නො. | 0.00369 | ලැ.නො. | 0.05165 |
| කළුතර | 0.01529 | 0.01662 | 0.10498 | 0.06918 | 0.05962 | 0.02613 |
| මහනුවර | 0.14228 | 0.04366 | 0.01141 | 0.00238 | 0.02006 | 0.01524 |
| මාතලේ | 0.06884 | 0.02872 | 0.06542 | 0.01048 | 0.08413 | 0.05767 |
| නුවරඑළිය | 0.2489 | 0.17654 | 0.00037 | 0.00012 | 0.00362 | 0.00366 |
| ගාල්ල | 0.03136 | 0.06394 | 0.05197 | 0.01666 | 0.05782 | 0.03129 |
| මාතර | 0.04246 | 0.07693 | 0.02647 | 0.01211 | 0.0724 | 0.04673 |
| හම්බන්තොට | 0.00048 | 0.00206 | 0.00047 | 0.00033 | 0.18836 | 0.09732 |
| යාපනය | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.04986 | 0.0174 |
| කිලිනොච්චිය | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.04804 |
| මන්නාරම | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.05577 | 0.01484 |
| වවුනියාව | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.05608 | 0.01281 |
| මුලතිව් | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.05394 |
| මඩකලපුව | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.08132 | 0.01797 |
| අම්පාර | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.03655 | 0.0212 |
| ත්‍රිකුණාමලය | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.03075 | 0.01531 |
| කුරුණෑගල | 0.00088 | 0.00007 | 0.01454 | 0.00483 | 0.45394 | 0.22604 |
| පුත්තලම | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.48125 | 0.16049 |
| අනුරාධපුරය | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.04744 | 0.04684 |
| පොළොන්නරුව | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | 0.05978 | 0.04571 |
| බදුල්ල | 0.15674 | 0.09707 | 0.01551 | 0.00137 | 0.00243 | 0.0086 |
| මොණරාගල | 0.02532 | 0.00573 | 0.05879 | 0.0116 | 0.05387 | 0.06654 |
| රත්නපුරය | 0.09798 | 0.0933 | 0.10234 | 0.05388 | 0.05161 | 0.03885 |
| කෑගල්ල | 0.03622 | 0.02409 | 0.13482 | 0.1119 | 0.12088 | 0.04848 |
| **ශ්‍රී ලංකාව** | **0.04521** | **0.02796** | **0.03131** | **0.01531** | **0.1089** | **0.05191** |

*ලැ.නො. : ලැබී නොමැති දත්ත*

*මූලාශ්‍රය : Population and Housing Censuses in 1963/2001. Census of Agriculture in 1962/2002. Department of Census and Statistics.*

ව්‍යාපාරික භෝග සමස්ත ප්‍රදේශයේ ම ජනගහනයෙන් බෙදු සාමාන්‍ය අගයන් දක්වීම අතාර්කික යැ යි එක්වර ම තීරණය කළ හැකි ය. ප්‍රතිලාභ සමාන ව බෙදී නො ගිය ද එම වගාවන් සමස්ත ආර්ථිකයටත්, ජනතාවටත් අයත් ඒවා ය. එනිසා එම වගාවන් නිසා ඇති වන යහපත් හෝ අයහපත් ප්‍රතිඵල සමස්ත ජනතාව ම අඩුවෙන් හෝ වැඩියෙන් බාර ගත යුතු වෙයි.

ප්‍රධාන ව්‍යාපාරික භෝග වගාවන්ගේ ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය පමණක් නොව, ග්‍රාමීය අංශයට විශේෂ වූ කුඹුරු ඉඩම් හා ගෙවතුවලින් එක් පුද්ගලයකුට සාමාන්‍ය වශයෙන් ලැබිය යුතු ප්‍රමාණය ද ක්‍රමයෙන් පහළ ගොස් ඇත.

## වගුව 3

### ඒක පුද්ගල කුඹුරු හා ගෙවතු ප්‍රමාණය (අක්කර)

| දිස්ත්‍රික්කය | 1973 | 2003/2004 | 2004/2005 | 2005/2006 | 2006/2007 |
|---|---|---|---|---|---|
| කොළඹ | 0.02343 | 0.0061 | 0.0061 | 0.00622 | 0.00622 |
| ගම්පහ | ලැ.නො. | 0.01473 | 0.0147 | 0.01649 | 0.01495 |
| කළුතර | 0.05896 | 0.03546 | 0.0355 | 0.03604 | 0.03596 |
| මහනුවර | 0.04025 | 0.0319 | 0.0319 | 0.03189 | 0.03197 |
| මාතලේ | 0.10574 | 0.09626 | 0.09647 | 0.09909 | 0.10175 |
| නුවරඑළිය | 0.03918 | 0.02241 | 0.02241 | 0.02265 | 0.02242 |
| ගාල්ල | 0.06175 | 0.04476 | 0.0448 | 0.505 | 0.04484 |
| මාතර | 0.08295 | 0.05628 | 0.05625 | 0.0567 | 0.05689 |
| හම්බන්තොට | 0.15523 | 0.12382 | 0.12431 | 0.12433 | 0.12417 |
| යාපනය | 0.08398 | 0.05399 | 0.05399 | 0.05338 | 0.05401 |
| කිලිනොච්චිය | ලැ.නො. | 0.40112 | 0.40112 | 0.40797 | 0.40813 |
| මන්නාරම | 0.40629 | 0.16289 | 0.16286 | 0.16274 | 0.16278 |
| වවුනියාව | 0.46967 | 0.26699 | 0.2682 | 0.26914 | 0.26932 |
| මුලතිව් | ලැ.නො. | 0.28331 | 0.28321 | 0.28806 | 0.28818 |
| මඩකලපුව | 0.3233 | 0.29573 | 0.29572 | 0.29508 | 0.29584 |
| අම්පාර | 0.33801 | 0.31188 | 0.31283 | 0.31317 | 0.31315 |
| ත්‍රිකුණාමලය | 0.25735 | 0.21672 | 0.21936 | 0.21727 | 0.21735 |
| කුරුණෑගල | 0.15418 | 0.13163 | 0.13163 | 0.13147 | 0.13157 |
| පුත්තලම | 0.08561 | 0.06434 | 0.6522 | 0.06515 | 0.06569 |
| අනුරාධපුරය | 0.39245 | 0.23404 | 0.23406 | 0.3448 | 0.23478 |
| පොළොන්නරුව | 0.41648 | 0.39138 | 0.39211 | 0.39294 | 0.3931 |
| බදුල්ල | 0.05546 | 0.07537 | 0.07537 | 0.07798 | 0.07673 |
| මොණරාගල | 0.13113 | 0.10966 | 0.11007 | 0.11683 | 0.14293 |
| රත්නපුරය | 0.07181 | 0.03747 | 0.0375 | 0.0375 | 0.03751 |
| කෑගල්ල | 0.04502 | 0.03 | 0.03 | 0.02997 | 0.03 |
| **ශ්‍රී ලංකාව** | **0.09911** | **0.09227** | **0.09245** | **0.09317** | **0.09357** |

ලැ.නො. : ලැබී නොමැති දත්ත

මූලාශ්‍රය : *Agricultural and Population Data, (1973). Statistical Abstract 2008. Department of Census and Statistics.*

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය ඓතිහාසික වශයෙන් ධාන්‍ය වගාව කේන්ද්‍ර කර ගන්නා ලද්දකි. මෙයින් වී වගාව ඉතා ම වැදගත් තැනක් ගන්නා ලදී. ඊට අමතර ව ගෙවතු වගාව පරිභෝජනය සඳහා වූ එළවළු, පලතුරු වැනි අනුපූරක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට භාවිතා කරන ලදී. මේ වගාවන් දෙකෙ හි අන්‍යෝන්‍ය බැඳියාව ස්වයංපෝෂිත ආර්ථිකය පවත්වා ගෙන යාමට ඉතාමත් අත්‍යාවශ්‍ය විය. ව්‍යාපාරික භෝග වගාව හඳුන්වා දුන්න ද මේ බැඳියාව අද දක්වා ම ග්‍රාමීය ආර්ථිකය තුළ ඉතා වැදගත් ස්ථානයක් ගනී.

පසුගිය දශක තුනකට ආසන්න කාලය තුළ ඒක පුද්ගල කුඹුරු හා ගෙවතු ඉඩම්වල ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් පහළ ගොස් ඇත. එය ජනගහන වර්ධනයට සමගාමී ව ඉඩම් සංවර්ධනය නො වීම නිරූපණය කරනු ලබයි. වී වගාව සම්බන්ධයෙන් වැදගත් වන අම්පාර, මඩකලපුව, පොලොන්නරුව, අනුරාධපුර, කුරුණෑගල වැනි දිස්ත්‍රික්ක ගත් විට කැපී පෙනෙන පහළ යාමක් පෙන්වයි (වගු අංක 3). මේ දිස්ත්‍රික්ක තවදුරටත් දේශීය කෘෂිකර්මාන්තය මත රැඳෙන බැවින් මෙම පහළයාමේ ප්‍රවණතාවය එකී ප්‍රදේශවල ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවා ගැනීම පිළිබඳ ප්‍රබල අභියෝගයක් වනු ඇත.

ශ්‍රී ලංකාවේ වැඩි වන ජනගහනයටත් වැඩි වන පරිභෝජනයටත් ගැළපෙන ලෙස ආහාර නිෂ්පාදනය ඉහළ මට්ටමකට ගෙන ආ යුතු ය. ප්‍රධාන කෘෂි නිෂ්පාදන ප්‍රදේශවල ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය පහළ යාම යනු ඒ ඉඩම්වලින් අතිරික්තයක් නිෂ්පාදනය කොට අනෙකුත් ප්‍රදේශවලට නොකඩවා සැපයීම පිළිබඳ අනාගත අවදානමක් පැවතීම යි.

ඒක පුද්ගල ඉඩම් හා ගෙවතුවල ප්‍රමාණය පහළයාම භෝග වගාවට පමණක් නොව සත්ව පාලනයට ද සෘජුව ම බලපෑම් කරන්නකි. විශේෂයෙන් ම ගවයින් පාලනයට මේ මඟින් කරන බලපෑම ඉතාමත් ඉහළ මට්ටමක පවතී යැයි අනුමාන කළ හැකි ය. සාම්ප්‍රදයික වශයෙන් මෙරට සතුන් පෝෂණය කිරීමට අවශ්‍ය කරන තෘණ භූමි වගා කිරීම සිදු නො කරයි. එසේ ම ඔවුන් බොහෝ විට නිදැල්ලේ හැසිරෙන අතරේ ම පෝෂණය වීමට ඉඩකඩ ඇත. ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය පහළ යාම ගවයින් වැනි සතුන් ඇති කිරීමට ග්‍රාමීය ජනතාව තුළ ඇති පෙළඹවීම කෙරෙහි අයහපත් ව බලපාන්නකි.

## 3. ඉඩම් කොටස් වෙමින් පැවතීම

පසුගිය කාලය පුරා ම මෙරට ග්‍රාමීය ඉඩම් ක්‍රමයෙන් කුඩා කැබලි බවට පත් වීම දක්නට ලැබිණි. අධික ජනගහනයක් ඇති තෙත් කලාපයේ සමහර ග්‍රාමීය ඉඩම් තුළ වාසය කිරීමට නිවසක් හද ගැනීමට වඩා වැඩි යමක් කළ නො හැක. තවත් ප්‍රදේශවල ඉඩම් කැබලි නිවාස තනා ගැනීමටවත් ප්‍රමාණවත් නැත. එසේ ම මෙවැනි බොහොමයක් ප්‍රදේශවල පොදු පහසුකම් සඳහා ඉඩම් නැත. එනිසා ක්‍රීඩා පිට්ටනි, උද්‍යාන, ජල පෝෂක ප්‍රදේශ, වනාන්තර ආදී කිසිවකට මේවායෙ හි ඉඩක් ලැබී නැත. නිවාස ඉදි කරන්නේ ද කිසිම පොදු පිළිගත් සැලැස්මකට නොවේ. ගම්මාන ව්‍යාප්තවීමත්, නිවාස ව්‍යාප්තවීමත් සිදු වන්නේ අයාලේ යන කටයුත්තක්

ලෙසට ය. එයින් ඇති වන අනාගත අතුරු ප්‍රතිවිපාක ඉතාමත් භයානක වනු ඇත.

නිවාස ඉදි කරගැනීම පිණිස ස්ථිර වගාවන් සහිත ඉඩම් කොටස් කර විකිණීම දනට කාලයක සිට අඛණ්ඩ ව සිදු වෙමින් පවතී. මේ නිසා පොල් වගාවන් සහිත ඉඩම් ඉතා විශාල ප්‍රමාණයක් කිසිම පාලනයකින් තොරව කොටස් කරමින් පවතී. මෙහි ආර්ථික ප්‍රතිවිපාක දනටමත් හඳුනාගෙන තිබේ. පොල් හිඟය, පොල් ආශ්‍රිත කර්මාන්තශාලා වැසීයාම ආදිය මේ අතුරින් වැදගත් වේ. එනිසා ඒ හා බැඳුණු රැකියාවන් ද ආදායම් මාර්ග ද විදේශ විනිමය ඉපැයීම් මාර්ග ද ක්‍රමයෙන් අහෝසි වෙමින් පවතී.

අනෙකුත් ව්‍යාපාරික භෝග වගාවන්ට වඩා පොල් වගාව මෙරට ආර්ථිකයටත් එහි ජන ජීවිතයටත් සුවිශේෂී වූවකි. එදිනෙද පරිභෝජනය උදෙසා රටට විශාල පොල් ප්‍රමාණයක් වුවමනා ය. ඊට අමතර ව ජන ජීවිතයෙහි විවිධාකාර වූ කුඩුමහත් කර්තව්‍යයන් සඳහා පොල් ගස අත්‍යාවශ්‍ය වූවකි. පාලනයකින් තොර ව පොල් වගාව විනාශ වන ලෙස ඉඩ ප්‍රස්ථාවන් විවෘත කරදීම මෙරට ජන ජීවිතයෙ හි කොඳු නාරටියට එල්ල කරන මරු පහරක් වැනි ය.

වෙනත් ව්‍යාපාරික භෝග වගාවන්ට වඩා පොල් වගාවෙන් සුවිශේෂ ආර්ථික වාසි සමූහයක් ලබා ගත හැකි ය. පොල් වගාව එසේ පවත්වාගෙන යන අතර ම කෙසෙල් අන්නාසි, ගම්මිරිස්, කෝපි, කොකෝවා හෝ වෙනත් අතිරේක භෝග එම භූමිය තුළ ම වගා කළ හැකි ය. පොල් වගාව තුළ සත්ව පාලනයට ද ඉඩ ප්‍රස්ථාවන් විවෘත ව පවතී. එසේ ම ශ්‍රමය ඇතුළු අනෙකුත් යෙදවුම් ඉතාමත් ම අවම මට්ටමක තබාගෙන දිගින් දිගට ම එලදාව ලබා ගත හැකි මෙරට ඇති එක ම ව්‍යාපාරික භෝගය පොල් ය. පොල් ඉඩම් කොටස්වලට කඩා, වගාව විනාශ කර දැමීම යනු ආයාසයකින් තොර ව රටට ලැබෙන ආදායම් මූලාශ්‍රයක් අදූරදර්ශී ලෙස වනසා දැමීමකි.

පොල් වගාවට පමණක් නොව, රබර් වගාවට ද මෙකී ඉරණම අත් වෙමින් පවතී. එනිසා ශ්‍රී ලංකාවට නුදුරු අනාගතයේ දී දනට ඇති රබර් ආශ්‍රිත කර්මාන්තවලට වඩා වැඩියෙන් ආනයනික රබර් මත රැඳීමට සිදු වනු ඇත. එසේ නැතිනම් කර්මාන්ත වසා දැමීමට සිදු වනු ඇත. නිවාස සඳහා ඉඩම් කොටස්වීම තේ වගාවට දනට ඉතා දැඩි ලෙස බලපා නැති නමුදු අනාගත ජනගහන වර්ධනය හා නිවාස ව්‍යාප්තිය සමඟ තේ ඉඩම් කොටස් වී යාමේ තර්ජනය ද බැහැර කළ නො හැක. කුඩා තේ වතු හිමියන්ගේ ඉඩම් දනටමත් මේ තර්ජනයට මුහුණ පා ඇත. තේ, රබර් හා පොල් ඉඩම් කොටස් කර, පදිංචිය සඳහා අලෙවි කළ ද කොපමණ ඉඩම් ප්‍රමාණයක් මෙසේ කට්ටි කර අලෙවි කර ඇද්ද යන්න පිළිබඳ ප්‍රාදේශීය මට්ටමෙන් හෝ ජාතික මට්ටමෙන් හෝ තොරතුරු දත්ත අනාවරණය කර ගත නො හැක.

ගොඩ ඉඩම් හැරුණු විට කුඹුරු ඉඩම් ද කොටස් වෙමින් පවතී. සමහර කුඹුරු නිවාස ඉදි කිරීම හෝ වෙනත් ව්‍යාපාර අරමුණු සඳහා ගොඩ කරයි. ඒ පිළිබඳ දත්ත එකතු කිරීමක් ද නැත. මේ ඉඩම් කුඩා වීම නිසා ආර්ථික වශයෙන් වඩා එලදායී ලෙස වගා කිරීමට ප්‍රමාණවත් ඉඩම් ලබා ගැනීම සමහර ප්‍රදේශවල ගැටළුවක් බවට පත් ව ඇත. මෙය අනාගතයේ දී තවදුරටත් උග්‍ර වනු ඇත.

ඉඩම් කොටස් වී යාම තේ, පොල්, රබර් හා වී වගාවට පමණක් නොව, එළවළු, පලතුරු වගාවන්ට ද සත්ව පාලන කටයුතුවලට ද අනාගතයේ දී විශාල තර්ජනයක් වනු ඇත. ඕනෑ ම වගාවක් ඵලදායී ලෙස කිරීමට අවශ්‍ය කරන අවම ඉඩම් ප්‍රමාණයක් ඇත. දනට ශ්‍රී ලංකාවේ එම අවම ප්‍රමාණයට වඩා පහළ ඉඩම් කට්ටිවල ප්‍රතිශතය වැඩි බව සඳහන් කළ හැකි ය.

මෙරට ආර්ථිකය නිදහස්කරණයත් සමඟ ඇති වූ කාර්මීකරණ හා නාගරීකරණ ක්‍රියාදමයෙ හි වැඩි අවාසිය සිදුව ඇත්තේ ප්‍රධාන වශයෙන් ම පොල් හා රබර් වගාවන්ට ය. වෙළෙඳ කලාප, කර්මාන්තපුර ජනාවාස හා නාගරීකරණ කටයුතු හා ඒවාට අවශ්‍ය කරන යටිතල පහසුකම් සැපයීමට පොල් හා රබර් වගාවන් ඉතා විශාල ප්‍රමාණයක් ඉවත් කරන ලදී. එක් ග්‍රාමීය විදුලිබල ව්‍යාපෘතියක් පමණක් ගත හොත් ඒ සඳහා ඉවත් කරනු ලබන පොල් හෝ රබර් ගස් ගණන අක්කර ගණනාවක වගාවට සමාන ය.

මෙරට කර්මාන්තපුර හා කාර්මික නගර ඉදි කළ යුතුව තිබුණේ ස්ථිර වගාවන් රහිත, කෘෂිකාර්මික කටයුතුවලට පහසුවෙන් යොද ගත නො හැකි ඉඩම් බහුල වියළි කලාපීය ප්‍රදේශයන් තුළ ය. එවැනි ප්‍රදේශවල යටිතල පහසුකම් දුර්වල නිසා ආරම්භයේ කළ යුතු ව තිබූ වියදම් තරමක් ඉහළ මට්ටමක පවතිනු ඇත. එහෙත් තෙත් කලාපීය ප්‍රදේශවල පසුගිය වකවානුවේ සිදුව ඇත්තේ සංවර්ධනයෙ හි නාමයෙන් නව ආදයම් මාර්ග විවෘත කිරීම සඳහා එතෙක් පැවති සමහර ආදයම් මූලාශ්‍ර වසා දමීමකි. වියළි කලාපය තුළ පවතින කර්කශ දේශගුණික තත්ත්වය නූතන සංවර්ධන කටයුතුවලට කෙසේවත් බාධාවක් නොවේ යැයි ප්‍රකාශ කළාට වරදක් නැත. ඊට හේතුව මැද පෙරදිග රටවල පවතින අන්තගාමී දේශගුණයට වඩා ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දේශගුණය කර්කශ බවින් පහළ මට්ටමක පැවතීම යි.

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදයික සමාජය ගම කේන්ද්‍ර කර ගත්තකි. පසුගිය වසර හතරක පමණ කාලය තුළ මෙරට ගම්වල සංඛ්‍යාව අඩු වී ඇත. එය ප්‍රධාන වශයෙන් ම නාගරීකරණයත්, නාගරික බල ප්‍රදේශ නැවත නිර්මාණය කිරීමත් නිසා සිදු වූවකි.

සමහර දිස්ත්‍රික්කවල ගම්මාන සංඛ්‍යාව වැඩි වී ඇත. එම වැඩි වීම මගින් පෙන්නුම් කරන්නේ ඉඩම් නැවත බෙදී යාමකි. මෙයින් සිදු වන්නේ පොදු ඉඩම් වශයෙන් තිබූ කැළෑ ආදිය ගම් බවට පත් වීම යි. එසේ නැතහොත් ව්‍යාපාරික භෝග සඳහා වෙන් කර තිබුණු වතු කොටස් කර, පදිංචි කිරීම සිදු කිරීම යි. මෙයින් දෙවනුව කී කරුණ මගින් සිදු වන්නේ වගාවන් සඳහා යොද ගත හැකි ව තිබුණු ඉඩම්වල ප්‍රමාණය පහළ යාමකි. ඊට අනුරූප ව නිෂ්පාදනයෙ හි හා ආදයම්වල ද පහළ යාමක් සිදු වෙයි.

මෙසේ නැවත ගම්මාන ඇති කිරීමත් සමඟ එහි වැසියන්ට කෘෂි කර්මාන්තයෙන් තම ජීවනෝපායයන් කරගෙන යාමට ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථාවන් විවෘත වන්නේ නැත. නව ගම්මාන බොහොමයක් ඇති වුවත් ඊට සරිලන ලෙස කුඹුරු හෝ වෙනත් වගාවන් කිරීමට අවශ්‍ය කරන ගෙවතුවල ප්‍රමාණය ඉහළ යන්නේ ද නැත. කිසි ම

වගාවකට නො යොදු හෝ එළදවන් රහිත ඉඩම් මේ සඳහා යොදවා ගත්තේ නම් නව ගෙවතු සමූහයක් නව ගම්මාන සමඟ බිහි වනු ඇත. ගම්මාන ව්‍යාප්ත වන උපනතිය දෙස මතුපිටින් බලන විට කෘෂි නිෂ්පාදනයෙ හි එවැනි ශුද්ධ ඉහළ යාමකට විවෘත වන ඉඩ ප්‍රස්තාවන් සීමිත ය.

## වගුව 4

### ශ්‍රී ලංකාවේ ගම්

| දිස්ත්‍රික්කය | ගම් ගණන 2002 | ගම් ගණන 2006 | වර්ධනය % |
|---|---|---|---|
| කොළඹ | 808 | 654 | -19.06 |
| ගම්පහ | 1,911 | 1,596 | -16.48 |
| කළුතර | 2,652 | 2,425 | -8.56 |
| මහනුවර | 2,987 | 2,758 | -7.67 |
| මාතලේ | 1,355 | 1,364 | 0.66 |
| නුවරඑළිය | 1,421 | 1,134 | -20.20 |
| ගාල්ල | 2,311 | 2,225 | -3.72 |
| මාතර | 1,598 | 1,659 | 3.82 |
| හම්බන්තොට | 1,319 | 1,355 | 2.73 |
| යාපනය | 954 | 1,208 | 26.62 |
| කිලිනොච්චිය | 684 | 684 | 0.00 |
| මන්නාරම | 527 | 398 | -24.48 |
| වවුනියාව | 516 | 516 | 0.00 |
| මුලතිව් | 258 | 258 | 0.00 |
| මඩකලපුව | 857 | 907 | 5.83 |
| අම්පාර | 876 | 709 | -19.06 |
| ත්‍රිකුණාමලය | 645 | 593 | -8.06 |
| කුරුණෑගල | 4,509 | 4,417 | -2.04 |
| පුත්තලම | 1,284 | 1,265 | -1.48 |
| අනුරාධපුරය | 3,085 | 2,114 | -31.47 |
| පොළොන්නරුව | 657 | 622 | -5.33 |
| බදුල්ල | 2,229 | 1,968 | -11.71 |
| මොණරාගල | 1,198 | 1,295 | 8.10 |
| රත්නපුරය | 1,941 | 2,016 | 3.86 |
| කෑගල්ල | 1,677 | 1,557 | -7.16 |
| ශ්‍රී ලංකාව | 38,259 | 35,697 | -6.70 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

## 4. කෘෂිකර්මාන්තයෙහි නියුක්ත නො වන විශාල පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල පදිංචි ව සිටීම

ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් කෘෂිකර්මාන්තයෙන් බැහැර නාගරික රැකියාවල නියුක්ත වූවෝ වෙති. තවත් පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල ම ඇති පාසල්, රෝහල් හා අනෙකුත් රාජ්‍ය ආයතනවල හෝ ග්‍රාමීය පෞද්ගලික ව්‍යාපාර, කර්මාන්තවල සේවය කරන්නෝ වෙති. ඔවුන් තම නිවාස ඉදි කිරීමටත්, ගෙවතුවලින් අතිරේක ආදායමක් උපයා ගැනීමටත්, නාගරික කලබලකාරී වාතාවරණයෙන් බැහැර ව ජීවත් වීමටත්, ග්‍රාමීය ප්‍රදේශ තෝරා ගෙන ඇත. ඒ හැරුණු විට ඔවුහු පාරම්පරික ඉඩම්වලට ඇති ඇල්ම නිසා ද ග්‍රාමීය ප්‍රදේශවල ම ජීවත් වෙති.

සංවිධිත අංශයෙ හි රැකියා අවස්ථා වැඩියෙන් බිහිවීමත් සමඟ තවදුරටත් ක්‍රමයෙන් වැඩි වන ග්‍රාමීය ජන ප්‍රතිශතයත් ගමෙන් බැහැර වූ රැකියාවල නියුක්ත වනු ඇත. ඔවුන්ගෙන් අතිමහත් බහුතරයක් අඩු ම තරමින් කෘෂිකාර්මික කටයුතුවල අර්ධකාලීන ව හෝ නියුක්ත වන්නෝ නො වෙති. ඔවුන් වාසය කිරීම සඳහා ම පමණක් ග්‍රාමීය ප්‍රදේශ තෝරා ගන්නා අතර, කෘෂිකාර්මික නිෂ්පාදනවලට ඔවුන්ගෙන් සිදුවන ශුද්ධ දයකත්වය සෘණ අගයක පවතින්නේ යැයි පැවසිය හැකි ය. ඊට හේතුව ඔවුන් වාසය කිරීම සඳහා භාවිත කරන ඉඩම් කෘෂි අංශයෙ හි කටයුතුවලට ලබා දෙන්නේ නම් එකී ප්‍රදේශවලින් දනට ලැබෙන කෘෂි ඵලදවට වඩා ඉහළ ඵලදවක් ලබා ගැනීමට බොහෝ විට අවකාශ ලැබීම යි.

මෙසේ නාගරික ප්‍රදේශවල රැකියාවන් කරන අය නිසා ග්‍රාමීය ප්‍රදේශවලට මුදල් ගලාගෙන එන බවත්, එනිසා එම ප්‍රදේශවලට අවශ්‍ය කරන ද්‍රවශීලතාවය එමඟින් ලැබෙන බවටත් තර්ක කළ හැකි ය. එසේ වුව ද ග්‍රාමීය ප්‍රදේශවලට ද්‍රවශීලතා ගලනයක් විය යුත්තේ එම ප්‍රදේශවල ම සිදු කෙරෙන ආර්ථික කටයුතු වෙළෙඳපොළ හරහා ගමන් කිරීමට ඉඩ ප්‍රස්ථාවන් විවෘත කිරීම මඟින් විනා මෙවැනි ඍජු ආර්ථික බැඳියාවකින් තොර වූ විකල්ප ක්‍රියා මාර්ගවලින් නොවේ. ග්‍රාමීය නිෂ්පාදන නාගරික හා ජාත්‍යන්තර වෙළෙඳපොළවලට සම්බන්ධ කිරීම මඟින් වඩා ශක්තිමත් ආර්ථික බැඳියාවක් ඇති කිරීම මේ සඳහා අනුගමනය කළ හැකි හොඳ ම ක්‍රියා මාර්ගය යි. ඒ සඳහා ප්‍රමාණවත් ඉඩම් වගා කටයුතු සඳහා ග්‍රාමීය ප්‍රදේශවල තිබිය යුතු ය.

කෘෂි නො වන ග්‍රාමීය ජනතාව තුළින් ග්‍රාමීය ඉඩම් සඳහා ඇති කරන පීඩනය වාසස්ථානවලට පමණක් සීමා වන්නේ නැත. ඔවුන්ට අවශ්‍ය කරන යටිතල පහසුකම් වන මාර්ග, විදුලිබලය, පණිවුඩ හුවමාරු කටයුතු, ජල සම්පාදනය, අපද්‍රව්‍ය බැහැර කිරීම ආදී කටයුතු වෙනුවෙන් ද සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් වෙන් කිරීමට සිදු වෙයි. මේවා නැවත වතාවක් කෙසේවත් කෘෂිකාර්මික කටයුතුවලට යොදවා ගත නො හැකි ඉඩම් බවට පත් වෙයි. මෙයින් ද ග්‍රාමීය අංශයෙ හි නිෂ්පාදන කටයුතු පහළ යාමට බලපෑමක් සිදු වෙයි.

ග්‍රාමීය ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශවලට දිනපතා රැකියාවලට පැමිණෙන ජනතාව තම කාලයෙන් සැලකිය යුතු කොටසක් ගමනාගමන කටයුතු වෙනුවෙන් වැය කරති. පොදුවේ ගත් කල ග්‍රාමීය ප්‍රදේශවල සිට නගරවලට රැකියාවන් සඳහා

ගමන් කරන අය ප්‍රවාහන අපහසුතා නිසා ඉමහත් දුෂ්කරතාවන්ට මුහුණ දෙති. එනිසා ඔවුන්ගේ ශ්‍රමයෙන් නියම ඵල ප්‍රයෝජන ලබා ගැනීමට ඔවුන් සේවා නියුක්ත ව ඇති ආයතනවලට ඇති ඉඩකඩ සීමාසහිත ය. එසේ ම ඔවුන්ට තමන් සතු පාරම්පරික ඉඩම්වලින් නියම ඵල ප්‍රයෝජන නෙළා ගැනීමට ද අවකාශයක් නැත.

## වගුව 5

### ශ්‍රී ලංකාවේ නාගරික ජන සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | 1981 | මුළු ජනගහනයෙන් % | 2001 | මුළු ජනගහනයෙන් % |
|---|---|---|---|---|
| කොළඹ | 1,264,284 | 74.4 | 1,417,427 | 63 |
| ගම්පහ | 388,342 | 27.9 | 371,971 | 18 |
| කළුතර | 178,071 | 21.5 | 113,840 | 10.7 |
| මහනුවර | 145,109 | 13.8 | 155,987 | 12.2 |
| මාතලේ | 38,108 | 10.7 | 36,103 | 8.2 |
| නුවරඑළිය | 37,288 | 6.2 | 47,711 | 6.8 |
| ගාල්ල | 166,371 | 20.4 | 137,853 | 13.9 |
| මාතර | 71,151 | 11.1 | 97,952 | 12.9 |
| හම්බන්තොට | 41,430 | 9.8 | 21,571 | 4.1 |
| යාපනය | 255,237 | 34.5 | ලැ.නො. | ලැ.නො. |
| කිලිනොච්චිය | 15,336 | 16.7 | ලැ.නො. | ලැ.නො. |
| මන්නාරම | 13,931 | 13.1 | ලැ.නො. | ලැ.නො. |
| වවුනියාව | 18,512 | 19.4 | 53143 | 35.5 |
| මුලතිව් | 7,192 | 9.3 | ලැ.නො. | ලැ.නො. |
| මඩකලපුව | 79,415 | 24.0 | 115,401 | 23.7 |
| අම්පාර | 53,276 | 13.7 | 112,536 | 19 |
| ත්‍රිකුණාමලය | 82,739 | 32.3 | 58,135 | 11.8 |
| කුරුණෑගල | 43,497 | 3.6 | 34,691 | 2.4 |
| පුත්තලම | 61,728 | 12.5 | 65,294 | 9.2 |
| අනුරාධපුරය | 41,392 | 7.0 | 53,151 | 7.1 |
| පොළොන්නරුව | 20,495 | 7.8 | ලැ.නො. | ලැ.නො. |
| බදුල්ල | 51,591 | 8.0 | 52,108 | 6.7 |
| මොණරාගල | 6,020 | 2.2 | ලැ.නො. | ලැ.නො. |
| රත්නපුරය | 59,213 | 7.4 | 59,533 | 5.9 |
| කෑගල්ල | 52,761 | 7.7 | 17,139 | 2.2 |
| **ශ්‍රී ලංකාව** | **3,192,489** | **21.5** | **3,021,546** | **16.5** |

ලැ.නො. : ලැබී නොමැති දත්ත

මූලාශ්‍රය : *Population Data. Statistical Abstract, (2008). Department of Census and Statistics.*

ග්‍රාමීය ප්‍රදේශවල ම රැඳී කෘෂිකර්මාන්තය ම ස්ථිර වශයෙන් ජීවනෝපාය ලෙස කරන අතිමහත් බහුතරයට ප්‍රමාණවත් ඉඩම් නැත. එනිසා ඔවුන්ගේ ආදායම් ඉහළ නංවා ගැනීමට ඇති ඉඩකඩ සීමාසහිත ය. ග්‍රාමීය අංශයෙ හි රැඳීමට නියම සුදුසුකම් ලබා ඇත්තේ මේ පිරිස යි. ඉඩම්වල නියම අයිතිය හිමි විය යුත්තේ ද මේ අයට මිස ඒවායේ නියම නිෂ්පාදනයන් රටට ලබාදීමට අපොහොසත් නාගරික අංශයේ රැකියාවල නියුක්ත වූ අයට නොවේ.

පසුගිය දශක දෙකකට ආසන්න කාලය තුළ ශ්‍රී ලංකාවේ නාගරික ජනගහනයේ ප්‍රතිශතය 5% පමණ පහළ ගොස් ඇත. අම්පාර, නුවරඑළිය හා මාතර වැනි දිස්ත්‍රික්ක කීපයක් හැරුණු විට අනෙකුත් බොහොමයක් දිස්ත්‍රික්කවල නාගරික ජනගහනයෙහි ප්‍රතිශතය අඩු වී තිබේ. නාගරීකරණය ඉතා වේගයෙන් සිදුවන බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුනේ ද නාගරික ජනගහනයේ ප්‍රමාණය සීඝ්‍ර ලෙස පහළ ගොස් ඇත. මෙය කෙසේවත් පිළිගත නො හැකි දෙයකි. පසුගිය කාලය තුළ ලංකාවේ නාගරික ජනගහනයෙ හි ප්‍රතිශතය ඉහළ යන ලදී. වර්තමානයේ බොහොමයක් ග්‍රාමීය ප්‍රදේශ නියම ලෙස නාගරික ප්‍රදේශ ගණයට සැලකුවාට වරදක් නැත. නාගරික ජනගහනයේ ප්‍රතිශතය මෙසේ පහළ යාමට තුඩු දෙන ලද්දේ පරිපාලනමය හේතු පදනම් කොට ප්‍රාදේශීය සභා හා නාගරික සභා බල ප්‍රදේශ නිර්ණය කිරීම යි.

පරිපාලන නිර්ණායක කුමක් වුවත් ආර්ථික නිර්ණායකයන් භාවිත කරන කල්හි වර්තමාන නාගරික නො වන ප්‍රදේශ සමූහයක කෘෂිකර්මාන්තය හෝ ඊට අදාළ කටයුතු කෙරෙන්නේ නැත. ඒ වෙනුවට ඒවා තුළ ඇත්තේ නිවාස, සුළු ව්‍යාපාර, කර්මාන්ත ආදිය යි. මෙවැනි ලක්ෂණයන් බහුල ව ඇති ප්‍රදේශ නියම වශයෙන් නාගරික ප්‍රදේශ ලෙස නම් කළාට වරදක් නැත.

## 5. ග්‍රාමීය අංශයේ ප්‍රමාණවත් පහසුකම් නො වීම

නූතන ජීවන රටාවේ බොහොමයක් ම අංගෝපාංග පරිණාමයට පත් වූයේ දියුණු රටවල නාගරික ප්‍රදේශ පදනම් කරගෙන ය. නළ ජලය, විදුලි බලය, වීථි ආලෝක කිරීම, තට්ටු නිවාස, සාප්පු සංකීර්ණ, භෝජන ශාලා, ක්‍රීඩා පිට්ටනි, රෝහල් ආදිය මෙයට නිදසුන් ලෙස දක්විය හැකි ය. වර්තමාන ජීවන පරිසරයට අදාළ වන මෙකී බොහෝ මූලික පහසුකම් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රමාණවත් ලෙස නැත. මෙවැනි පහසුකම් පවතින අවස්ථාවල වුව ද විශ්වසනීයත්වයෙන් යුතු ව හා ගුණාත්මක බවින් ඉහළ මට්ටමකින් ඒවා ලබා ගැනීම පිළිබඳ ව සීමාකම් පවතී. නිදසුන් ලෙස ග්‍රාමීය ප්‍රදේශවල විදුලි බලය හා ජල සැපයුම ඇණහිටීමේ වාර ගණන වැඩි ය. බොහෝ ප්‍රදේශවල වීථි ආලෝකය කෙසේත් ම නැත. ජලය ලබා ගැනීමට කිලෝ මීටර් ගණනාවක් පයින් ගමන් කිරීමට සිදු වෙයි. ජංගම දුරකථනවල පවා තරංග දුර්වල මට්ටමක පවතී. බොහෝ ග්‍රාමීය මාර්ග ගමනාගමනයට සුදුසු මට්ටමක නැත. තවත් තැනක බොහෝ විට ඇත්තේ අඩි පාරවල් පමණි. එවැනි තැන්වල දී ගැමි ජනයා ඉමහත් ආයාසයකින් යුක්ත ව තම භාණ්ඩ හිසේ හෝ කරේ තබාගෙන ප්‍රවාහනය කරති. රෝගීන් පුටු මත තබාගෙන කිලෝමීටර් ගණනක් පයින් ඔසවා ගෙන යති.

වර්තමාන ජීවන වටපිටාවට අවශ්‍ය කරන මාර්ග පද්ධති, දුම්රිය මාර්ග වැනි පහසුකම් රට පුරා ම විසිරී ඇති සියලු ම ග්‍රාමීය ප්‍රදේශවලට ලබා දීමට ද නුපුළුවන. ඒ සඳහා විශාල මුදලක් ආයෝජනය කිරීමත්, ඒවා නඩත්තු කිරීමත්, ඒවා ඉදි කිරීම වෙනුවෙන් විශාල ඉඩම් ප්‍රමාණයක් දිගින් දිගට ම කෘෂිකර්මාන්තයෙන් ඉවත් කිරීමත් තර්කානුකූල නැත. රටේ සෑම ග්‍රාමීය ප්‍රදේශයක් ම මනාව ආවරණය වන පරිදි ජලනළ පහසුකම්, මහමාර්ග හා අතුරු මාර්ග, ආදී බොහෝ නූතන පහසුකම් ලබාදීම කවර රටකටවත් කළ නො හැකි දෙයකි.

ශ්‍රී ලංකාවේ කුටුම්භවලින් 20% කට පමණ තවමත් විදුලි බලය නැත. මේවායින් අති මහත් බහුතරයක් පවතින්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. මේ සියල්ලට ම විදුලි බලය සැපයීමටත්, විදුලිබල පද්ධති නඩත්තු කිරීමටත් විශාල වියදමක් දැරීමට සිදු වෙයි. එසේ ම විදුලි රැහැන් ඇදීම උදෙසා ආර්ථික ඵලදාවක් ලබා දෙන පොල්, කොස්, දෙල් හා අනෙකුත් ගස් විශාල සංඛ්‍යාවක් ඉවත් කිරීමට සිදු වෙයි. එසේ සිදු කළ ද පරිසරාත්මක බාධාවන් නිසා නිතර නිතර විදුලි බලය ඇණහිටීම වැළැක්වීමට නො හැකි මට්ටමකට පත් වී ඇත. ජාතික විදුලිබල පද්ධතියෙන් ප්‍රයෝජනයට නො ගෙන කාන්දුවන ප්‍රමාණය ශ්‍රී ලංකාවේ වෙනත් බොහෝ රටවලට වඩා ඉහළ මට්ටමක පවතී. ග්‍රාමීය ප්‍රදේශ සඳහා විදුලිබලය තව තවත් ව්‍යාප්ත කිරීමත් සමඟ මෙසේ කාන්දු වන විදුලිබල ප්‍රමාණය තවත් ඉහළ යනු ඇත. එසේ අපතේ යන ප්‍රමාණයත් අවසාන වශයෙන් පිරිවැයට එකතු කළ විට පාරිභෝගිකයන් මත අමතර බරක් පැටවීම වළක්වාලිය නො හැක. විදුලි බලය භාවිත කරමින් කරන නිෂ්පාදනවලට ජාතික හා ජාත්‍යන්තර වෙළෙඳපොළේ තරඟ කළ නො හැක.

ජල පහසුකම් සම්බන්ධයෙන් ද පවතින්නේ ඉහත කී ගැටලුවට සමාන වූවකි. ශ්‍රී ලංකාව පුරා ම නළ ජලය ලබාදීමට කිසි ම හැකියාවක් නැත. වර්තමාන ග්‍රාමීය ආර්ථික ක්‍රියාකාරකම් දෙස බලන කල තවත් කොතෙක් කාලයක් ප්‍රයෝජනයට සුදුසු ජලය ළිංවලින් ලබා ගත හැකි වේ ද යන ගැටලුව නො සලකා හැරිය හැකි දෙයක් නොවේ. නාගරික ප්‍රදේශවලට ජලය සපයන පෝෂිත ප්‍රදේශ පවතින්නේ ද ග්‍රාමීය ප්‍රදේශවල යි. ග්‍රාමීය ප්‍රදේශවලට ආගන්තුක වූ වර්තමාන මානව ක්‍රියාකාරකම්වලට අයාලේ කටයුතු කිරීමට තවදුරටත් නිදහස ලබා දෙන්නේ නම් නාගරික ජල සැපයුම ද අනාගතයේ දී මහත් අනතුරුදායක තත්ත්වයකට මුහුණ දෙනු ඇත.

කැළි කසළ ඉවත් කිරීමේ පහසුකම් බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල නාමිකවවත් නැත. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල මේ ගැටලුව ඉතාමත් උග්‍ර තත්ත්වයකට පත් ව ඇත්තේ ඒ පිළිබඳ ව නිසි කළමනාකරණයක් නොමැති බැවිනි. නාගරික ප්‍රදේශවල කුඩා භූමි ප්‍රදේශයකට මෙවැනි පහසුකම් සැපයිය හැකි වුවත් ග්‍රාමීය නිවාස රටපුරා ව්‍යාප්තවීමත් සමඟ කුණු කසළ ඉවත් කිරීමේ පහසුකම් ව්‍යාප්ත කිරීම ඉතාමත් සීමාකාරී දෙයක් වනු ඇත.

ග්‍රාමීය අංශයෙ හි පවත්නා වූ ආර්ථික ගැටලුවලට පිළියමක් ලෙස සමහර කර්මාන්ත ගමට ගෙන යා යුතු යැයි යෝජනා කරන අවස්ථාවන් ඇත. එවැනි යෝජනාවන් ක්‍රියාත්මක වූ අවස්ථාවන් ද පසුගිය වකවානුවල දී දැකිය හැකි විය. කර්මාන්ත

ස්ථානගත වීමේ දී සලකා බැලිය යුතු සාධක සමූහයක් පවතී. බොහෝ ග්‍රාමීය ප්‍රදේශවලට කර්මාන්ත ගෙන යා යුත්තේ මෙකී සුදුසුකම් නැතිව ය. රාජ්‍ය අංශය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත්වය දරූ වකවානුවල කර්මාන්ත ස්ථානගත වීමේ මූලික සුදුසුකම් නො සලකා දේශපාලන තීන්දු මත ප්‍රාදේශීය වශයෙන් හුදකලා වූ කර්මාන්ත ආරම්භ කළ යුගයක් විය. අද ඒවායෙන් බොහොමයක් ම වැසී ගොස් ය. පවතින ස්වල්පයක් වූ ආයතනවල ද නිෂ්පාදන පිරිවැය ඉතාමත් ඉහළ ය. බොහෝ ආයතන පවත්වාගෙන යන්නේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ආධාර මත ය. එසේ නැති ව ලාභදායී ලෙස ඒවා පවත්වාගෙන යාම ඉතාමත් ම අසීරු කටයුත්තක් බවට පත් ව තිබේ. මෙකී රාජ්‍ය ආයතනවල අකාර්යක්‍ෂමතාවට එක ම හේතුව ඒවා ස්ථානගත කිරීමේ කොන්දේසි උල්ලංඝනය කිරීම නො වුවත් එය ප්‍රධානතම අවාසිදායක සාධකයක් ලෙසට දැක්විය හැකි ය.

දුර්වල යටිතල පහසුකම් නිසා පෞද්ගලික අංශය ග්‍රාමීය අංශය තුළ කර්මාන්ත අංශයෙ හි ආයෝජනය කිරීමට පෙළඹවීම ඉතාමත් දුෂ්කර කටයුත්තකි. දේශපාලන ආශිර්වාද මත කරන පෙළඹවීම්වල නිරසාර බව පිළිබඳ ව ප්‍රමාණවත් අසාර්ථක අත්දැකීම් ශ්‍රී ලංකාව සතු ව ඇත.

අධ්‍යාපන පහසුකම්වල ඌනතාවය අනෙකුත් බොහෝ පහසුකම්වලට වඩා ග්‍රාමීය ජනතාවට දැඩි ව බලපාන්නකි. බොහෝ ග්‍රාමීය පාසල්වලට ප්‍රමාණවත් යටිතල පහසුකම් වන ගොඩනැගිලි, විද්‍යාගාර, පරිගණක මධ්‍යස්ථාන, ක්‍රීඩා පිට්ටනි ආදිය නොමැත. මානව සම්පත්වල ඌනතාවය මේ සියල්ලන්ටමත් වඩා දැඩි ව බලපාන්නකි. එක් අතකට ප්‍රමාණවත් ගුරුවරුන් නැත. අනෙක් අතට ගුරුවරු සිටිය ද විද්‍යා, ගණිත, ඉංග්‍රීසි සහ ක්‍රීඩා ගුරුවරුන් සපයා ගැනීම ඉතාමත් අපහසු කටයුත්තකි. නාගරික ප්‍රදේශවල මේ ගුරුවරුන්ගේ අතිරික්තයක් ද පවතී. ඔවුන් ග්‍රාමීය ප්‍රදේශවලට යාමට කැමති නැත. පසුගිය ආණ්ඩු මගින් විවිධාකාර වැඩපිළිවෙළ යටතේ ග්‍රාමීය ප්‍රදේශවලට ගුරුවරුන් ලබා දුන්න ද ඔවුන් විවිධ උපක්‍රම භාවිතා කරමින් නැවත නැවතත් නගරය කරා ගමන් කරයි. ඉතා දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල මෙකී තත්ත්වය උග්‍ර මට්ටමකට පැමිණ ඇත. එවැනි ප්‍රදේශවල වාසය කරන දෙමාපියන්ට තම දරුවන් නාගරික පාසල් කරා එවීමේ ආදයම් මාර්ග හෝ ඒ සඳහා අවශ්‍ය කරන දේශපාලනික හා සමාජ සබඳතාවයන් ද නැත. එනිසා ග්‍රාමීය ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රතිශතයකට නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ නියමාකාරයෙන් හිමි වන්නේ නැත.

බැංකු, රක්‍ෂණ හා වෙනත් වාණිජ සේවාවන් ද ග්‍රාමීය අංශයට ප්‍රමාණවත් ව ලැබෙන්නේ නැත. එසේ ලැබෙන අවස්ථාවල පවා ඇතැම් විට ඒවායෙ හි ගුණාත්මක බව අඩු ය. එසේ නැතිනම් මිල ගණන් වැඩි ය. එවැනි පහසුකම් සපයන ආයතනවලට ද පහළ පිරිවැයක් යටතේ තම කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් ගනුදෙනුකරුවන් ග්‍රාමීය ප්‍රදේශවලින් සපයා ගැනීම දුෂ්කර වෙයි.

ප්‍රවාහන පහසුකම් ග්‍රාමීය ප්‍රදේශවල පවතින්නේ ඉතාමත් පහළ මට්ටමක ය. ග්‍රාමීය ප්‍රදේශ හරහා ගමන් කරන ප්‍රධාන මාර්ගවල වාසය කරන සුළු පිරිසකට ප්‍රවාහන

පහසුකම් ඇතත් අතුරු මාර්ගවල වාසය කරන අයට ඇත්තේ සීමිත ප්‍රවාහන පහසුකම් ය. එසේ නැතහොත් කොහෙත් ම එම පහසුකම් නැත.

මෙවැනි බොහෝ පහසුකම් රජය මැදිහත් ව ලබාදිය යුතුය යන සරළ තර්කය ඉදිරිපත් කිරීම පහසු ය. එහෙත් ඒ සඳහා මූලික වියදම් දැරීමත්, ඒවා නඩත්තු කිරීම උදෙසා වියදම් වෙන් කිරීමත් සීමාකාරී මට්ටමක පවතී. සමහර දියුණු රටවල්වල නාගරික ප්‍රදේශවල ඇති පහසුකම් ග්‍රාමීය අංශයට ද ලබාදිය යුතුය යන නීති ඇත. එහෙත් එකී රටවල ග්‍රාමීය ජනගහනයේ ප්‍රතිශතය ඉතාමත් පහළ මට්ටමක පවතී. එනිසා කළ යුතු වියදම් අඩු ය. ඒ සඳහා එම රටවල් සතු සම්පත් ද වැඩි ය.

## 6. ග්‍රාමීය තිරසාරභාවය සම්බන්ධයෙන් හානිකර මානව ක්‍රියාකාරකම්

වර්තමානයෙ හි ග්‍රාමීය අංශයෙ හි සිදුවන මානව ක්‍රියාකාරකම් නිසා එහි ශතවර්ෂ ගණනාවක් පැවති තිරසාර බව නැවත වතාවක් කිසි දිනක ළඟාකර ගත නො හැකි පරිද්දෙන් විනාශ වෙමින් පවතී.

වියළි කලාපයෙ හි ජල පෝෂක ප්‍රදේශවල ද වැව් තාවුළුවල ද ගඩොල් කැපීම, නිවාස ඉදි කිරීම, වගාවන් සඳහා ඉඩම් එළි පෙහෙළි කිරීම කරණ කොටගෙන මෙරට සංස්කෘතියෙ හි අනන්‍යතාවය තහවුරු කරන එක් වැදගත් සංකේතයක් වූ වැව නඩත්තු කිරීම දුෂ්කර තත්ත්වයට පැමිණ ඇත. වර්ෂා කාලයෙ හි ජලය සමඟ විශාල පස් ප්‍රමාණයක් වැව් තටාකයට පැමිණීමෙන් කුඩා වැව් ඉතා විශාල ප්‍රමාණයක් දැන් ගොඩ වී ඇත. එනිසා ඒවාට රඳවා ගත හැකි ජල ප්‍රමාණය ද ඉතාමත් සීමාසහිත ය. මාස් කන්නයෙ හි අතරින්පතර වී වගාව සඳහා ජලය මුදා හළ විට යල කන්නයේ වගාවන් සඳහා වැව්වල ජලය කොහෙත් ම ඉතිරි වන්නේ නැත. බොහෝ කුඩා වැව් දැන් යල කන්නය ආරම්භවීමටත් පෙර ම ජලය රහිත හිස් පිට්ටනි බවට පත් වෙයි. සෑම ගමකට ම සාම්ප්‍රදායික වශයෙන් වෙන් කොට තිබුණු පොදු ඉඩම් හෝ වනාන්තර දැන් කිසිවක් නොමැති තරම් ය (Denis, A. and Fernando, N. 1986). සාම්ප්‍රදයික ගමේ නිවාස ඉදි නො කළ යුතු තැන්වල ද දැන් නිවාස ඉදි වී ඇත. සමහර ගම්වල නිවාස ඉදි කිරීම හැරුණු විට වගා කිරීමට ඉඩම් නොමැත. වර්තමාන පරිභෝජන සංස්කෘතිය මඟින් හඳුන්වා දෙන ලද ප්ලාස්ටික් බෝතල්, පොලිතින් කවර හා ඉක්මනින් දිරාපත් නො වන අපද්‍රව්‍යවලින් ගමත් ගමේ පරිසරයත් විනාශ වෙමින් පවතී.

විදුලි බලය ලබාදීම, මාර්ග ඉදි කිරීම හා කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ වෙනත් ආර්ථික කටයුතු වෙනුවෙන් ග්‍රාමීය ඉඩම්වලින් ඉතා විශාල ප්‍රමාණයක් ද ඒවායෙ හි වෘක්ෂලතා ආදිය ද ඉවත් වෙමින් පවතී. ග්‍රාමීය ප්‍රදේශ මිනිසුන්ගේ ම බූදලයක් නොවේ. එය සතා සිවුපාවාටත් අයිති ය. එහෙත් වර්තමාන ඉඩම් හා ග්‍රාමීය සම්පත් පරිහරණය තුළ බොහෝ සතුන් හා ශාක නැවත කිසි දිනකවත් ආපසු ලබාගත නො හැකි පරිද්දෙන් අපෙන් ඈත් වෙමින් පවතී. අලි-මිනිස් ගැටුම මඟින් පෙන්වා දෙන වැදගත් පාඩමක් වන්නේ ද මේ කරුණ ම ය. අලි තරම් ශක්තිමත් නොවූ කුඩා සිවුපාවුන්, කුරුල්ලන් හා ශාක වර්ග නිසොල්මනේ අපෙන් සමු ගනිමින් සිටිති. නැතහොත් දැනටමත් සමුගෙන හමාර ය.

අනේකවිධ වූ වන සිවුපාවුන්, කුරුල්ලන් හා උරගයන් නිසා අතීතයේ දී ශ්‍රී ලංකාව ඉමහත් ප්‍රසිද්ධියක් ලැබූ රටකි. වර්තමානයේ බොහෝ පිටිසර දුරස්ථ ප්‍රදේශවල පවා වන සතුන් දක බලා ගැනීම උගහට ය. දන් ක්ෂේම භූමි පවා ආක්‍රමණය කරමින් මානව ජනාවාස ව්‍යාප්ත වෙමින් පවතී. විවිධ මානව අවශ්‍යතාවන් උදෙසා ඒවායෙ හි ගස්වැල් කපා දමති. හේන් වගාව සඳහා යොදා ගනිති. ගවයින්ට තෘණ කැවීමට භාවිතා කරති. ඒ හැරුණ විට ඒවායෙ හි වාසය කරන සතුන් ආහාරය සඳහා දඩයම් කරති. තවත් වැඩි කාලයක් ගතවීමට පෙර මෙකී ක්ෂේම භූමි සහ ඒවායෙ හි සිටින සතුන් ස්වල්ප දෙනා ද වඳවී යාමේ තර්ජනය කෙසේවත් බැහැර කළ නො හැක.

මීට කාලයකට පෙර හෝ ග්‍රාමීය ප්‍රදේශවල මදුරු උවදුර පැවතුනේ නැත. වියළි කලාපයේ වරින් වර මැලේරියා උවදුර පැවතුණත් තෙත් කලාපීය ප්‍රදේශවල මදුරු තර්ජනයෙන් තොර ව ජීවත් විය හැකි විය. වර්තමාන බොහෝ ග්‍රාමීය ප්‍රදේශ මදුරුවන්ගේ පීඩාව නිසා විවිධාකාරයේ රෝග පීඩාවන් ව්‍යාප්ත වෙමින් පවතී. මදුරු දැල් නොමැතිව රාත්‍රී කාලය ගත කිරීම කෙසේවත් කළ නො හැකි දෙයක් බවට පත් ව ඇත.

පාංශු සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ කිසි ම වැඩපිළිවෙළක් ග්‍රාමීය අංශයෙහි ක්‍රියාත්මක නො වන තරම් ය. ගොඩ හා මඩ ඉඩම්වල පාංශු සංරක්ෂණය වන ලෙස ජලය බැසයාමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක වන්නේ නැත. මේ නිසා වර්ෂාව සමඟ පසේ සාරවත් කොටස නිරන්තරයෙන් සෝදා පාලුවට ලක් වෙයි. තවත් කාලයක් ගත වන විට කෘත්‍රිම පොහොරවලින් තොර ව කිසිම වගාවක් කළ නො හැකි මට්ටමකට ග්‍රාමීය ප්‍රදේශ පත්වීම වැළැක්විය නො හැකි වනු ඇත. සෝදපාලුව වැළැක්වීමට විශේෂයෙන් වෙන් කර තිබුණු වගා නො කරන ඉඩම් සියල්ල, ළඳු ප්‍රදේශ, කැළෑ යන සියල්ල වර්තමානයෙ හි විවිධාකාර මානව ක්‍රියාකාරකම් සඳහා භාවිත වෙමින් පවතී. මෙම වාතාවරණය තුළ ග්‍රාමීය ප්‍රදේශවල පැවති ස්වභාවික ශාක හා සත්ව පද්ධතීන් මුළුමනින් ම විනාශ වී යාමේ තර්ජනය ආසන්නයෙ හි දනට මෙරට ග්‍රාමීය අංශය පසු වෙයි.

## 7. කාල කළමනාකරණ අභියෝගය

ශ්‍රී ලංකාවේ වර්තමාන ග්‍රාමීය ප්‍රදේශ නගර හා සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යයි. නවීකරණ බලවේග ග්‍රාමීය අංශය කරා තව තවත් ව්‍යාප්තවීමත් සමඟ නගරය සමඟ තිබිය යුතු සම්බන්ධය ද තවදුරටත් ඉහළ යනු ඇත. එනිසා ග්‍රාමීය සාමාන්‍ය ජීවිතයෙ හි බොහෝ කටයුතු නාගරික පරිසරය සමඟ බැඳුණු ඒවා බවට පත් වෙයි. මේ නිසා කලාතුරකින් නගරය කරා පැමිණි අය දන් නිශ්චිත කාල පරාසයක් තුළ වැඩි වාර ගණනක් නගරයට පැමිණෙති. ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරමින් නගර සමඟ සමීප සම්බන්ධයක් පවත්වාගෙන යන අයගේ කාලයෙන් ඉතා වැඩි කොටසක් ගමනාගමන කටයුතු උදෙසා වැය වෙයි. අධ්‍යාපනය සඳහා ගමේ සිට නගරයට පැමිණෙන පාසල් සිසුන්ගේ කාලයෙන් ද වැඩි කොටසක් ගමනාගමනය සඳහා වැය වෙයි. එසේ ම රෝහල, තැපැල් කන්තෝරුව හා අනෙකුත් රාජ්‍ය ආයතනවලට

පැමිණීම සඳහා ද භාණ්ඩ මිලට ගැනීම වෙනුවෙන් නගරයට පැමිණීම සඳහා ද තම කාලයෙන් වැඩි කොටසක් වැය කිරීමට ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන අයට සිදු ව තිබේ. කොපමණ කාලයක් නාස්ති වේ ද නැති ද යන්න ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ නගරයේ සිට තම නිවසට ඇති දුර ප්‍රමාණය සහ මාර්ග පහසුකම්වල ස්වභාවය මත ය. දහවල් කාලයෙ හි ප්‍රවාහන පහසුකම් ඇතත් සවස් කාලය වන විට නාගරික ප්‍රදේශවල සිට බොහෝ ග්‍රාමීය ප්‍රදේශවලට ගමන් කිරීමට පොදු ප්‍රවාහන පහසුකම් නොමැත. එවැනි අවස්ථාවල අඩු ආදායම්ලාභීන් වැඩි දෙනෙක් විශාල කාලයක් ගත කොට පයින් ගමන් කිරීමට පුරුදු ව සිටිති. මේ නිසා ගම්වල වාසය කරන අයට ආදායම් ඉපයීමේ කටයුතුවලට යොදවා ගත හැකි කාලය සීමාසහිත වෙයි. මෙකී අවාසිදයක වාතාවරණය ඉදිරියේ දී තවදුරටත් වර්ධනය වනු ඇත.

ග්‍රාමීය ජනතාව විසින් නගරයේ දී ලබා ගන්නා බොහෝ සේවාවන් පරිමාණානුකූල පිරිමැසුම් සහිතව හා ඉහළ ගුණාත්මක බවකින් යුක්ත ව සෑම ග්‍රාමීය ප්‍රදේශයකට ම ව්‍යාප්ත කළ නො හැක. එනිසා එවැනි සේවාවන් තව තවත් ව්‍යාප්ත වනු ඇත්තේ නාගරික ප්‍රදේශවල විනා ග්‍රාමීය ප්‍රදේශවල නොවේ.

නගරයේ දී සැපයෙන බොහෝ සේවාවන් එකිනෙකට බැඳුණු සේවා කට්ටල (පැකේජ) වශයෙන් ඉදිරිපත් වෙයි. නිදසුන් ලෙස උදේ නගරයේ පාසල්වලට පැමිණෙන ළමුන් සවස නගරයේ ම ඇති අතිරේක පන්තිවලට සම්බන්ධ වෙයි. එසේ ම ප්‍රතිකාර ලබාගැනීමට නගරවලට එන රෝගීන් වෛද්‍යවරයා මුණගැසීම, ලේ හා මුත්‍රා පරීක්ෂණ කරවා ගැනීම, බෙහෙත් මිලට ගැනීම ආදිය නගරයේ ඇති සේවා ස්ථාන කිහිපයකින් කරවා ගනී. ඇඳුම් මිලට ගැනීමට එන ගැමියා ද ඇඳුම් එක තැනකින් ද ඊට ගැළපෙන සෙරෙප්පු හෝ සපත්තු තවත් තැනකින් ද බෑගය තවත් තැනකින් ද මිලට ගනී. ග්‍රාමීය සුළු නිෂ්පාදකයා තම නිෂ්පාදන නගරයේ විවිධ තැන්වලින් මිල ගණන් විමසා හොඳ ම මිලකට ඒවා අලෙවි කොට ලැබෙන ආදායමින් නගරයේ ඇති විවිධ ස්ථානවලින් තමන්ට අවශ්‍ය දේවල් මිලට ගනී. මෙවැනි පැකේජ සේවාවන් ග්‍රාමීය අංශය තුළ කෙසේවත් ප්‍රවර්ධනය කළ නො හැකි ය.

ග්‍රාමීය අංශයේ පවත්නා වූ සීමිත සේවාවන්ගේ වුව ද මිල හා ගුණාත්මක බව පාරිභෝගිකයා සෑහීමකට පත් නො කරයි. භාණ්ඩවල විවිධත්වය ග්‍රාමීය අංශය තුළ ලබා ගත නො හැක. එනිසා ග්‍රාමීය ප්‍රදේශයේ දී සුදුසු ම දේ තෝරා ගැනීමට පාරිභෝගිකයාට අවකාශයක් ලැබෙන්නේ නැත.

මේ හැරුණු විට බොහෝ සේවාවන් ග්‍රාමීය අංශය තුළ කොහෙත් ම ලබා ගත නො හැක. නිදසුනක් ලෙස බැංකු, රක්ෂණ, ඉන්ධන ආදි සේවාවන් ග්‍රාමීය අංශය තුළ ලබා ගැනීම දුෂ්කර ය.

ඉහත කී වාතාවරණය තුළ ග්‍රාමීය ජනතාවට තම අත්‍යවශ්‍ය සේවාවන් ලබා ගැනීමට නගරය කරා පැමිණීම අවශ්‍ය වෙයි. එනිසා කාල කළමනාකරණය පිළිබඳ ගැටලුව ඉදිරියේ දී තව තවත් උග්‍ර අතට හැරෙනු ඇත.

## 8. අඩු සුරක්ෂිත බව

වර්තමානයෙ හි වඩා සුරක්ෂිත පහසුකම් සහිත ජීවන පරිසරයක් පවතින්නේ නාගරික ප්‍රදේශ තුළ ය. ප්‍රමාණවත් ආදායම් මාර්ග පවතින්නේ නම් නාගරික පරිසරය තුළ වඩා ඉහළ ජීවන මට්ටමක් පහසුවෙන් සකස් කර ගත හැකි ය. දැනට ශ්‍රී ලංකාවේ පවතින බොහෝමයක් නාගරික ගැටලු, පරිපාලනය, කළමනාකරණය හා ආකල්පමය දුර්වලතාවන් නිසා ඇති වූ ඒවා ලෙස සඳහන් කළාට වරදක් නැත. නිදසුන් ලෙස නාගරික ප්‍රදේශවල පවතින අපද්‍රව්‍ය බැහැර කිරීම, මැසි මදුරු තර්ජන, මුඩුක්කු නිවාස, වාතය හා ශබ්ද දූෂණය ආදී කරුණු දැක්විය හැකි ය. අයාලේ සිදුවන ග්‍රාමීය නිවාස ව්‍යාප්තියත් සමඟ මෙකී ප්‍රශ්න බොහෝමයක් ම දැනට ග්‍රාමීය යැයි සඳහන් ප්‍රදේශයන් ද ආක්‍රමණය කර ඇත.

ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන විට නගරයෙ හි නොමැති අනතුරුදායක බවක් ඇත. මේවායින් සමහරක් ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව ස්වභාවධර්මයා විසින් ඇති කරන ලද ඒවා ය. තවත් සමහරක් පරිපාලන දුර්වලතා, අකාර්යක්ෂමතාවන් හෝ වෙනත් මානව චර්යා රටාවන් නිසා මතු වූ ඒවා ය.

ඉතා හොඳ සෞඛ්‍ය පහසුකම් පවතින්නේ නාගරික ප්‍රදේශවල ය. නගරයක තම වාසස්ථානයේ සිට ප්‍රධාන රෝහලට හෝ බෙහෙත් ශාලාවකට ඇත්තේ ඉතා ම කෙටි දුරකි. මාර්ග පහසුකම් ද හොඳ ය. ප්‍රවාහන මාධ්‍යයන් ද දවසේ ඕනෑ ම වේලාවක පහසුවෙන් ලබා ගත හැකි මට්ටමක පවතී. ග්‍රාමීය පරිසරය මීට බොහෝ සෙයින් වෙනස් තත්ත්වයක පවතී. එවැනි ප්‍රදේශවල රෝගාතුර වූවන් රෝහලට ගෙන ඒමට සැලකිය යුතු කාලයක් ගත වෙයි. රාත්‍රී කාලයක රෝගාතුර වූවේ නම් සමහර විට රෝගීන් රෝහලට ගෙන ආ යුත්තේ ඊළඟ දවසේ දී ය. ඒ වන විට රෝගය තවදුරටත් උත්සන්න වීම සිදු වෙයි. සමහර රෝගවලට ක්ෂණික ව ප්‍රතිකාර ලබා ගත යුතු වෙයි. එහෙත් ඉතාමත් දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල මෙවැනි පහසුකම් නැත. වල් අලි හා වෙනත් සතුන්ගෙන් ද සර්පයින්ගෙන් ද අනතුරු සිදුවීමට ඇති ඉඩකඩ ග්‍රාමීය ප්‍රදේශවල ඉහළ ය. මේ හැරුණ විට මිනිසාට මිනිසාගෙන් ම සිදුවන අනතුරු ග්‍රාමීය ප්‍රදේශවල වැඩි යැයි පැවසිය හැකි ය. ප්‍රධාන නගර අතර පොදු වාහනවල ගමන් කිරීමටත්, තම නිවාස නගරයේ නම් ඒ කරා බසයෙන් හෝ දුම්රියෙන් ගොස් බැස ආරක්ෂා සහිතව යාමටත් ඉඩ කඩ ඇත. එක් අතකට ග්‍රාමීය ප්‍රදේශවල ඇති ආසන්නතම නගරයට රාත්‍රී කාලයේ වුවත් පැමිණීමට ඉඩකඩ ඇතත් එතැන් සිට තම නිවසට යාමට පහසුකම් නැත. එසේ පහසුකම් තිබුණ ද ප්‍රධාන මාර්ගයේ සිට අතුරු මාර්ගයන් ඔස්සේ නිවසට ආරක්ෂා සහිත ව යාමට නුපුළුවන. කාන්තාවන් සම්බන්ධයෙන් මෙය වඩාත් සත්‍ය කරුණක් බව තහවුරු වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රාදේශීය නගරවලට අග නගරයෙ හි සිට මධ්‍යම රාත්‍රියෙ හි වුව ද පොදු ප්‍රවාහන පහසුකම් මඟින් ළඟා විය හැකි ය. සමහර එවැනි නගරවලට දවසේ පැය විසි හතර පුරා ම එකී පහසුකම ඇත. එහෙත් ප්‍රාදේශීය නගරයේ සිට ග්‍රාමීය ප්‍රදේශවලට සැපයෙන පොදු ප්‍රවාහන පහසුකම් හවස හය හෝ හත පමණ

වන විට නතර වෙයි. වඩාත් දුෂ්කර ප්‍රදේශවල සවස හතර හෝ පහ පමණ වන විට මේ පහසුකම නතරවීම සාමාන්‍ය දෙයකි. එවැනි ස්ථානවල රෝහල්, පාසල් හා වෙනත් නාගරික සේවාවන් ලබා ගැනීමට පැමිණෙන අය අතරමංවීම හෝ බොහෝ දුරක් පයින් ගමන් කිරීම සාමාන්‍ය දෙයකි.

## 9. සිරස් හා තිරස් ජනාවාස ව්‍යාප්තිය

වර්තමාන ලෝකයෙ හි සංවර්ධිත රටවල ජනාවාස බොහෝ විට ම ව්‍යාප්ත වන්නේ තිරස් අතට නොව සිරස් අතට ය. මේ රටවල නාගරික ප්‍රදේශවල අහස උසට ඉදි කරන ලද තට්ටු නිවාසවල විශාල ජනකායක් ජීවත් වෙති. නාගරික ජනඝනත්වය වැඩිවීමත් සමඟ මෙකී රටවල පාලනයකින් තොරව වාසස්ථාන තිරස් අතට ගමන් කරන්නේ නැත. මේ නිසා විශාල නගර තුළ ක්‍රීඩා පිට්ටනි, උද්‍යාන හා වනාන්තර ආදිය දැකිය හැකි ය. එසේ ම ප්‍රධාන නගරවලට ආසන්නයෙන් ම ගොවිපොළ, සත්ව පාලන කටයුතු හා ආහාර සැකසුම් මධ්‍යස්ථාන ආදිය ස්ථානගත ව ඇත. එනිසා නගරවල ජීවත්වන දහස් ගණන් ජනතාවට අවශ්‍ය කරන නැවුම් එළවළු, පලතුරු, කිරි හා වෙනත් ආහාර ද්‍රව්‍ය නගර ආසන්නයෙන් ම ලබා ගත හැකි ය.

ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල් බොහොමයක ජනාවාස ව්‍යාප්ත වන්නේ තිරස් අතට ය. ඒවා ද කිසිම සැලැස්මකට හෝ පාලනයකට අනුව සිදුවන කටයුතු නොවේ. මේ නිසා මෙවැනි ජනාවාස සහිත ප්‍රදේශ තිරසාර පදනමක් මත පවත්වාගෙන යාම පිළිබඳ ව මහත් අභියෝගයන් මතු වෙයි. එසේ තිරස් අතට ව්‍යාප්ත වනුයේ සාරවත් තෙත් බිම් ජනාවාස ලෙස පරිවර්තනය කරමිනි.

වගුව 6

### ශ්‍රී ලංකාවේ නගර ව්‍යාප්තිය

| වර්ෂය | නගර ගණන | වර්ධනය (%) |
|---|---|---|
| 1871 | 19 | 0.00 |
| 1881 | 20 | 5.26 |
| 1891 | 20 | 0.00 |
| 1901 | 28 | 40 |
| 1911 | 36 | 28.57 |
| 1921 | 42 | 16.67 |
| 1931 | 42 | 0.00 |
| 1946 | 42 | 0.00 |
| 1953 | 43 | 2.38 |
| 1963 | 45 | 4.65 |
| 1971 | 49 | 8.89 |
| 1981 | 51 | 4.08 |
| 2001 | 55 | 7.84 |

*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.*

කොළඹ, මහනුවර, ගාල්ල වැනි නගර කිහිපයක නාගරික කේන්ද්‍රයන් කිසියම් සැලැස්මකට ඇතත් එයින් ඈත්වීමත් සමඟ මෙම ක්‍රමානුකූල බව වෙනුවට දකිය හැක්කේ අක්‍රමවත් ව අයාලේ ගිය ජනාවාසයන් ය. එසේ ම ඒවාට අවශ්‍ය කරන ක්‍රීඩා පිට්ටනි හෝ උද්‍යාන වැනි පොදු පහසුකම් නැත. මෑතකාලයෙ හි වර්ධනය වූ අනෙකුත් නාගරික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් තත්ත්වය ද මෙසේ ම පවතී. ශ්‍රී ලාංකිකයෝ බොහෝ දුර බැහැර සිට විහාරමහාදේවී උද්‍යානය හා ගාලු මුවදෙර පිටිය නැරඹීමට කොළඹට පැමිණෙති. මේවා යටත්විජිත වකවානුව තුළ නිර්මාණය කරන ලද ඒවා ය. එහෙත් මෑත කාලයෙ හි ශ්‍රී ලංකාවේ වෙනත් තැන්වල දියුණු වූ නගර තුළ ද උද්‍යාන හා ක්‍රීඩා පිට්ටනි තනා ගැනීමට උනන්දුවක් දක්නට නැත. ඉඩම් අක්කර කිහිපයක් වෙන් කොට පැළ සිටුවා උද්‍යානයක් නිර්මාණය කිරීමට විදේශ ආධාර හෝ විශාල ධනස්කන්ධයක් අවශ්‍ය වන්නේ නැත. එසේ ම වෙරළාසන්න නගර තුළ ගාලු මුවදෙරට ද වඩා ආකර්ෂණීයත්වයකින් යුක්ත උද්‍යාන තනා ගැනීමට ද විශාල වියදමක් යන්නේ නැත. එහෙත් අක්‍රමවත් ව තිරස් අතට ව්‍යාප්ත වන නාගරික හා ග්‍රාමීය ජනාවාස තුළ මෙවැනි පහසුකම් සැපයීම දුෂ්කර ය.

ශ්‍රී ලංකාවේ වර්තමානයෙ හි සැලසුමකින් තොරව තිරස් අතට ජනාවාස ව්‍යාප්තවීම තුළ නගරාසන්න ව පිහිටි බොහොමයක් ග්‍රාමීය ජනාවාස අර්ධ නාගරික හෝ නාගරික ප්‍රදේශ බවට පත් ව ඇත. සැලසුමකින් හෝ මනා කළමනාකරණයකින් තොර මේ නාගරීකරණය තුළ පරිසරාත්මක සහ සමාජමය ගැටලු බොහොමයක් නිර්මාණය වී තිබේ (Legg, C. and Jewell, N. 1992). ඒ හැරුණ විට නගර විසින් ක්‍රමානුකූල ව මෙලෙස ගිලගනු ලබන්නේ සශ්‍රීක කෘෂිකාර්මික ඉඩම් ය. නාගරික ජනපද ව්‍යාප්තවීමත් සමඟ මේ ඉඩම්වලින් ලැබුණු කෘෂි නිෂ්පාදනයන් ද අහෝසි වී යයි. එනිසා එවැනි නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාවට අවශ්‍ය කරන ආහාරපාන සියල්ල ම පාහේ වෙනත් දුරබැහැර ප්‍රදේශවල සිට ප්‍රවාහනය කිරීමට සිදුව ඇත. එම ප්‍රදේශවල ද ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය අඩු වෙමින් පවතින නිසා අනාගතයේ දී අතිරික්ත නිෂ්පාදනයන් කළ නො හැකි වනු ඇත. එසේ රට තුළින් ආහාර ලබා ගත නො හැකි නම් ඒවා ආනයනය කිරීමට සිදු වෙයි. වුවමනාවට වඩා ආනයනික ආහාර මත රැඳීම ඉතාමත් අන්තරායකාරී දෙයකි. විශේෂයෙන් ම ප්‍රමාණවත් ආහාර තොග පවත්වා ගෙන යාමට ආර්ථික ශක්තිය හෝ වුවමනාවක් නොමැති වාතාවරණයක් තුළ මේ තත්ත්වය තවත් උග්‍ර අතට පත් කරනු ලබයි.

කොළඹ ඇතුලු විශාල නගරවල ජනාවාස තිරස් අතට ගමන් නො කළේ නම් ඊට ආසන්න බොහොමයක් කෘෂිකාර්මික ඉඩම් ආරක්ෂා කරගැනීමට ඉඩකඩ තිබිණි. එය එසේ වූවා නම් කොළඹ ඇතුළු තවත් බොහෝ නගරවල වැසියන්ට අවශ්‍ය කරන එළවළු, පලතුරු, කිරි වැනි ආහාරපාන පමණක් නොව, ධාන්‍ය අවශ්‍යතාවන්ගෙන් බොහොමයක් ම ඒ ආසන්නයෙන් ම සපුරා ගැනිමට ඉඩකඩ තිබුණි. ඒ පමණක් නොව, මෙවැනි නගරාසන්න වඩා විශාල උද්‍යාන, ක්‍රීඩා පිටි, වනාන්තර ද පවත්වාගෙන යාමටත් පරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීමටත් ඉඩකඩ තිබුණි. කපුටන්, පරෙවියන්, මීයන්, කැරපොත්තන් හෝ මදුරුවන් හැරුණුකොට වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල හෝ ඒ ආසන්නයෙන් වෙනත් සතුන් හෝ කුරුල්ලන් දකීම ඉතාමත් අපහසු කටයුත්තක් බවට පත් වෙමින් තිබේ.

කොළඹ හා ඊට තදසන්න නගර හා උප නගර ගතහොත් ඒවා ආසන්නතම ග්‍රාමීය ප්‍රදේශ ආක්‍රමණය කිරීම මඟින් සිදු කරන හානිය වැළැක්වීම සඳහා නාගරික තට්ටු නිවාස ක්‍රම ක්‍රියාත්මක කළ හැකි ය. එවිට ඒවායෙ හි දැනට ජීවත් වන ජනගහනයට වඩා කිහිප ගුණයක ජනගහනයකට ජීවත්වීමේ පහසුකම් ලබා ගත හැකි වන්නේ ය. රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශය ම දැනට වඩා ආක්‍රමණශීලී ව මේ සඳහා මැදිහත් කරගැනීමේ වැඩපිළිවෙළක් අවශ්‍ය වෙයි. එවිට මේ නාගරික මධ්‍යස්ථානවලට ආසන්නතම ඉඩම් ආදයම් ඉපැයෙන කෘෂිකාර්මික හා සත්ව පාලනය වැනි කටයුතු සඳහා භාවිත කළ හැකි වන්නේ ය.

## 10. ග්‍රාමීය අනන්‍යතාවය ආරක්ෂා කරගැනීම

රටේ ග්‍රාමීය ප්‍රදේශ ප්‍රධාන වශයෙන් ම වෙන් විය යුත්තේ ග්‍රාමීය ජන ජීවිතයට ඇලුම් කරන ජනතාවටත්, කෘෂිකාර්මික හෝ සත්ව පාලන කටයුතුවල නියුක්ත වූවන්ටත් ය. එසේ නැතිව ගම යොදා ගත යුත්තේ නගරයේ හෝ වෙනත් රටක දකින ලද විවිධාකාර නාගරික මෝස්තරයන් නිර්මාණය කිරීමට නොවේ. අධ්‍යාපනය හෝ වෙනත් මාධ්‍යයන් මඟින් නාගරික සංස්කෘතියක් මනස තුළ නිර්මාණය කර ගන්නා අය ජීවත් විය යුත්තේ නගරවල මිස ග්‍රාමීය ප්‍රදේශවල නොවේ. එවිට ග්‍රාමීය අනන්‍යතාවය ආරක්ෂා කරගැනීමටත්, ඒවායේ නිෂ්පාදන මාර්ග වැඩිදියුණු කිරීමටත්, ග්‍රාමීය පරිසර සංරක්ෂණයටත් ඉඩකඩ ලැබේ.

ශ්‍රී ලාංකික ග්‍රාමීය ජනතාවගෙන් අතිමහත් බහුතරයක් තම අනාගත අභිවෘද්ධිය සකසා ගැනීම සඳහා අධ්‍යාපනය ලැබීමටත්, රැකියා කිරීමටත්, විවිධ පුහුණු වැඩසටහන් සඳහාත් නාගරික ප්‍රදේශවලට පැමිණෙති. තවත් සමහරු විදේශ රටවල නගරවලට ද ගමන් කරති. කාලයත් සමඟ ඔවුන්ගේ මනස නාගරික මෝස්තරවලින් පිරී යයි. එසේ වූවත් ඔවුහු කුඩා කල හැදුණු වැඩුණු ග්‍රාමීය පරිසරයට ද ඇළුම් කරති. ඒ අතර ම ඔවුහු පාරම්පරික ඉඩම් හා වෙනත් දේපළවලට ද මහත් ගිජුකමක් දක්වති. එනිසා මේ අය තම මනසේ වැඩුණු නාගරික මෝස්තර ගමට ගෙන එති. ඒවායින් ග්‍රාමීය පරිසරයට හානියක් මිස ඒවායෙහි නිෂ්පාදනයන් ඉහළ දැමීමට හෝ ග්‍රාමීය පරිසරය ප්‍රවර්ධනය කිරීමට හෝ එහි අනන්‍යතාවය ඉහළ නැංවීමට රුකුළක් ලැබෙන්නේ නැත.

නාගරික මෝස්තරවලින් මනස පුරවා ගත් මෙකී අය සඳහා ප්‍රාදේශීය නාගරික මධ්‍යස්ථාන ඇති කළ හැකි ය. ඒවා තුළ ඔවුන්ට අවශ්‍ය කරන නාගරික පහසුකම් ද නාගරික මෝස්තරයන් ද නිර්මාණය කළ හැකි ය. එයින් ග්‍රාමීය ප්‍රදේශවල නිෂ්පාදන කටයුතුවලට හෝ පරිසරයට සිදුවන හානිය අවම කර ගත හැකි ය. එසේ ම එය ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන කෘෂිකර්මාන්තයෙ හි නියුක්ත ජනතාවට එම කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩම් ලබා ගැනීමේ ගැටලුවට ද තරමක හෝ සහනයක් ලබා ගත හැකි වනු ඇත.

## 11. නිගමනය

ග්‍රාමීය අංශ මුහුණ දෙන ඉහත කී අර්බුද විසඳ ගැනීම සඳහා ලබා ගත හැකි එක් තිරසාර විසඳුමක් වන්නේ ක්‍රමවත් නාගරීකරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම යි. දනට ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන සියලු ම දෙනා කොළඹ, ගාල්ල හෝ මහනුවර වැනි ප්‍රධාන නගරවලට ගෙන ආ යුතු බවක් මෙයින් අදහස් වන්නේ නැත. ඒ වෙනුවට තිරසාර පදනමක් යටතේ ප්‍රාදේශීය නගර සංවර්ධනය කළ හැකි ය. ඒවායෙ හි ජීවත් වන ජනතාවට රැකියා අවස්ථා, කර්මාන්ත හෝ සේවා අංශ තුළ ජනනය කළ හැකි ය. එසේ ම ප්‍රාදේශීය නගරවල වාසය කරන ජනතාවගෙන් කොටසක් නගරයේ සිට කෘෂිකාර්මික රැකියාවන් උදෙසා දිනපතා ග්‍රාමීය ප්‍රදේශවලට ගමන් කරන අයගෙන් සමන්විත වනු ඇත.

දනට ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන, එහෙත් කෘෂිකර්මාන්තයෙ හි නියුක්ත නො වන කොටස ප්‍රාදේශීය නගර කරා සංචලනය කිරීමට අවශ්‍ය කරන ක්‍රියාමාර්ග මුලින් ම ගත හැකි ය. මේ සංචලනය ස්වේච්ඡාවෙන් කළ යුත්තක් නිසා ඒ සඳහා ක්‍රියාමාර්ගයන් දෙකක් අනුගමනය කළ හැකි ය. එක් ක්‍රියාමාර්ගයක් වන්නේ ප්‍රාදේශීය නගරවල ආකර්ෂණීය නිවාස හා වෙනත් පොදු පහසුකම් ඇති කිරීම යි. අනෙක නම්, ග්‍රාමීය ප්‍රදේශවලට තිරසාර පදනමකින් තොර ව ලබා දෙන නිල සහන ක්‍රමයෙන් අඩු කිරීම යි.

ප්‍රාදේශීය නගරවල ඇති කරන නිවාස වාරික ගෙවීමේ පදනම මත ස්ථිර ව ම මිලට ගැනීමට හෝ කුළී පදනමක් මත ජීවත්වීමට ඉඩ ප්‍රස්ථාවන් ලැබෙන පරිදි ඉදි කළ හැකි ය. නගරය තුළ ඇති සෞඛ්‍ය, අධ්‍යාපන, උද්‍යාන, ක්‍රීඩා පිට්ටනි වැනි පොදු පහසුකම් මඟින් ජනතාව නගරය කරා ගෙන්වීමේ දිරි ගැන්වීම් කළ හැකි ය. කෙසේ වෙතත් මෙවැනි විසඳුමක් ඉතා කෙටි කලකින් ලබා ගත නො හැකි වනු ඇත. කාලයක් තිස්සේ ජනතාව තුළ පැලපදියම් ව ඇති ආකල්ප ඉතා ඉක්මනින් වෙනස් නොවේ. නූතන පරම්පරාවල අය ඉලක්ක කරගනිමින් මෙවැනි ව්‍යාපෘතීන් ආරම්භ කළ විට අනාගතයේ දී අතිමහත් බහුතර ජනතාවක් නාගරික ප්‍රදේශවල ජීවත් වනු ඇත. එය ග්‍රාමීය ආර්ථිකය මුහුණ දෙමින් සිටින අනාගත අර්බුදයට තිරසාර විසඳුමක් වනු ඇත.

කෙටිකාලීන ව ගම් තුළින් ම ග්‍රාමීය අර්බුදයට විසඳුමක් ද ලබා ගත හැකි ය. මෙය ශ්‍රී ලංකාවේ පැරණි ගමක පැවති ජනාවාස රටාව නැවත හඳුන්වාදීම යි. ඒ අනුව ජනතාවට පදිංචිවීම සඳහා ගම්වල විශේෂ ප්‍රදේශයක් ප්‍රවර්ධනය කළ හැකි ය. එහි ගෙවල් ඉතාමත් ආසන්නයෙන් ඉදි වනු ඇත. මෙය පැරණි ගම්ගොඩ ක්‍රමය යටතේ පැවති ජනාවාස රටාවට ආසන්න වූවකි. පොදු පහසුකම් වන ජලය, විදුලිබලය, මාර්ග ආදිය මේ තෝරා ගත් ප්‍රදේශයට පමණක් සීමා කරන අතර ඒවා එයින් ඔබ්බට ගෙන යන්නේ නම් පෞද්ගලික වියදම් මඟින් කරගැනීමට අවකාශ ඇතත් නිල අනුග්‍රහය ඒ සඳහා ලැබෙන්නේ නැත.

ප්‍රාදේශීය නගර සියල්ල ම වඩා හොඳ මහා මාර්ග හා දුම්රිය මාර්ග මඟින් ප්‍රධාන නගර සමඟ සම්බන්ධ කළ හැකි ය. ඒවාට ඕනෑ ම අවස්ථාවක පොදු ප්‍රවාහන පහසුකම් යටතේ ගමන් කිරීමේ ඉඩකඩ ද සලසා දිය හැකි ය. මෙවැනි ප්‍රාදේශීය නගරවලට අවශ්‍ය කරන අධ්‍යාපන, සෞඛ්‍ය ආදී පහසුකම් පමණක් නොව, සාප්පු, ක්‍රීඩා පිට්ටනි, බොජුන්හල් ආදී නූතන නාගරික පහසුකම් සියල්ල ම ද සකසා දිය හැකි ය. ඇතැම් ප්‍රාදේශීය නගරවල කර්මාන්ත කෘෂි යෙදවුම් අමුද්‍රව්‍ය වශයෙන් භාවිත කරමින් දියුණු කළ හැකි ය. තවත් නගරවල සත්ව පාලන හෝ ධීවර කටයුතු මේ සඳහා භාවිත කළ හැකි ය. එසේ ම තවත් නාගරික මධ්‍යස්ථාන වෙළෙඳාම, අධ්‍යාපනය හා අනෙකුත් සේවාවන් පිළිබඳ විශේෂත්වයක් දක්වනු ඇත.

ග්‍රාමීය ප්‍රදේශවල ඇති ඉතාමත් කුඩා ගොවිපොළ වෙනුවට මධ්‍යම හා මහා පරිමාණ ගොවිපොළ ද සත්ව පාලන කටයුතු ද දියුණු කළ හැකි ය. කුඩා ඉඩම් හිමියන්ට තම ඉඩම අලෙවි කොට නගරයෙන් නිවසක් ලබා ගැනීමට පොළඹවන ආකාරයේ ආර්ථික හා සමාජ අන්තර්ගතයන් ප්‍රාදේශීය නගරය තුළ තිබිය යුතු ය. කුඩා නිෂ්පාදකයෙකුට අවශ්‍ය නම් ග්‍රාමීය ප්‍රදේශ තුළ වාසය කළ හැකි ය. ගමේ අනන්‍යතාවයට හානිකර ප්‍රවණතාවන් ඇතිවීම වැළැක්වීමට හෝ ඒවා සඳහා නො වුවමනා නිල දිරි දීමනාවන් නැවැත් වූ විට ඔවුන් ඉහළ ආදායම් සහිත නාගරික රැකියා කරා යනු ඇත.

ප්‍රධාන හා උප නාගරික මධ්‍යස්ථානවලට ආසන්න ඉඩම්වල ඒවාට අවශ්‍ය කරන ආහාරපාන ආදිය නිෂ්පාදනය කළ හැකි ය. වඩා දුරස්ථ ප්‍රදේශවල ආහාරපාන නිෂ්පාදනවල අතිරික්තයක් පවතින්නේ නම් ඒවා අපනයනයට අවශ්‍ය කරන දිරි දීමනාවක් ලබා දිය හැකි ය. එවැනි අතිරික්ත නිෂ්පාදන පදනම් කරගෙන කර්මාන්ත ද ආරම්භ කළ හැක.

ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රයෙන් වර්තමානයෙ හි සිදු කෙරෙන කුඩා පරිමාණ නිෂ්පාදන ඒකක පදනම් කරගෙන ජාත්‍යන්තර වෙළෙඳපොළ දිනා ගැනීම අපහසු ය. ඒ සඳහා පරිමාණ පිරිමැසුම් මධ්‍යම හෝ මහා පරිමාණ ගොවිපොළ ඇති විය යුතු ය. දැනට කුඩා ගොවිපොළ නිෂ්පාදන ප්‍රධාන ලෙස මෙරට නාගරික මධ්‍යස්ථානවලට පැමිණේ. එහෙත් ඒවායේ ගුණාත්මක බව හෝ මිල ගණන් පිළිබඳ සෑහීමකට පත් විය නො හැකි ය. අනෙක් අතට ඒවායෙ හි නිෂ්පාදකයෝ ද අනේකවිධ දුෂ්කරතාවයන්ට පත් ව සිටිති. ඔවුන්ගේ ආදායම් පහළ ය. දරිද්‍රතාවය ඉහළ මට්ටමක පවතී. තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දිය නො හැක. ග්‍රාමීය ප්‍රදේශවල ඇති පාසල්වල ප්‍රමාණවත් පහසුකම් ද නැත. ග්‍රාමීය ජනතාවගෙන් කොටසකට නාගරික ප්‍රදේශවලට යාමට ඉඩ ප්‍රස්ථාවන් විවෘත කර දෙන විට කැමැත්තෙන් ග්‍රාමීය අංශයෙ හි ඉතිරි වන අයට පෙරට වඩා වැඩි ඉඩම් ප්‍රමාණයක් ද ලැබෙනු ඇත. ඒවා වගා කරන විට පෙරට වඩා වැඩි නිෂ්පාදනයක් ද ආදායමක් ද උපයා ගත හැකි ය. ඔවුන්ට දරිද්‍රතා මට්ටමෙන් ඉහළ ආදායම් උපයා ගැනීමට ද ඉඩ ප්‍රස්ථාවන් විවෘත වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. සේනාරත්න, පී.ඇම්. (2005). ශ්‍රී ලංකාවේ වනාන්තර. සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

2. Denis, A. and Fernando, N. (1986). 'Forest Surveys in Sri Lanka Using Remote Sensing Methods.' The Sri Lanka Forester, Volume xvii, January - December. Sri Lanka Forest Department, Battaramulla.

3. Department of Census and Statistics,(1962). Sri Lanka Census of Agriculture, General Report - 1962. Department of Census and Statistics, Colombo.

4. Department of Census and Statistics, (1963). Population and Housing Statistics -1963. Department of Census and Statistics, Colombo.

5. Department of Census and Statistics, (1973). Sri Lanka Census of Agriculture, General Report - 1973. Department of Census and Statistics, Colombo.

6. Department of Census and Statistics, (1982). Sri Lanka Census of Agriculture, General Report - 1982. Department of Census and Statistics, Colombo.

7. Department of Census and Statistics, (2001). Population and Housing Statistics 1981/2001. Department of Census and Statistics, Colombo.

8. Department of Census and Statistics, (2002). Sri Lanka Census of Agriculture, Report on Estate Sector - 2002. Department of Census and Statistics, Colombo.

9. Department of Census and Statistics, (2007). Statistical Abstract - 2007. Department of Census and Statistics, Colombo.

10. Department of Census and Statistics, (2007). Statistical Abstract - 2008. Department of Census and Statistics, Colombo.

11. Legg, C. and Jewell, N. (1992). 'A 1:50000 Scale Forest Map of Sri Lanka : The Basis for a National Forest Geographic Information System'. The Sri Lanka Forester, Volume xx, January - December. Sri Lanka Forest Department, Battaramulla.